# සුචරිතයේ ද්වාරය

# INTEGRITY PORTAL

විද්‍යුත් සඟරාව | මංගල කලාපය

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

**இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு**

**COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION**



CIABOC


No 36, Malalasekera Mawatha, Colombo 07, Sri Lanka.
Telephone - **+94 112 596360, Hotline-1954**, Fax - +94 112 595045
email - ciaboc_gen@ciaboc.gov.lk

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

# සුපිළිපන් ද්වාරය

# INTEGRITY PORTAL

විද්‍යුත් සඟරාව | මංගල කලාපය




**උපදේශන සංස්කාරක**
රුවිනි වික්‍රමසිංහ මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

**සංස්කාරක මණ්ඩලය**
අමා විජේසිංහ මිය
ශානිකා හෙයියන්තුඩුවගේ මිය
ශිලා මේෂ වැලිතොටගේ මහතා
ටී.එම්.එන්.කේ. තෙන්නකෝන් මෙනවිය

**සහය සංස්කාරක මණ්ඩලය**
ටී.ඩබ්.කේ. එරංගා මධුෂි කුමාරි මෙනවිය
එන්.ඩී.එන්. චමෝදි ජයසිංහ මිය
දිල්රුක්ෂි චන්ද්‍රසේකර මිය

**ඡායාරූප සංස්කරණය රූ රටා**
ෂම්මි ශ්‍රීලාල් මහතා
ඉෂානි විජේසූරිය මිය

**සම්බන්ධීකරණය**
සම්පත් ක්‍රසිංහ ආරච්චිගේ මහතා
රුශාන්ති දිල්ශානි මෙනවිය

**සෝදුපත් කියවීම**
දිනූෂා ලක්මාලි මිය

**පිටු සැකසුම හා කවර නිර්මාණකරණය**
www.designwaves.lk



# කතෘ වැකිය

අල්ලස හා දූෂණය තුරන් කරමින් සුපිළිපන්න දේශයක් කරා යන අරමුණ පෙරදැරිව කටයුතු කරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, නිවාරණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීමේ තවත් දැවැන්ත පියවරක් ලෙස සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් දොරට වඩින ”සුපිළිපන්න ද්වාරය” සය මාසික සඟරාවේ මංගල කලාපය ඔබ අභිමුව දිග හරිනුයේ ඉමහත් සතුටිනි.

අල්ලස හා දූෂණය විෂය පථය පිළිබඳව දැනුම සහ අවබෝධය ලබාගැනීමේ අපේක්ෂාවෙන් පසුවන මහජනතාවට මෙය මහඟු තෝතැන්නක් වනු නොඅනුමාන ය. නූතන විද්‍යාවේ මං පෙත් ස්පර්ශ කරමින් මෙවැනි විද්‍යුත් සඟරාවක් එළි දැක්වීම තුළින්, වඩාත් නිවැරදි වූත්, කාලීන වූත්, හරවත් දැනුම් සම්භාරයක් ලබාදීමට ගත් මෙම උත්සාහය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ලද විශිෂ්ට ජයග්‍රහණයක් ලෙස හැඳින්විය හැකි ය.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් මූලාරම්භය තබන මෙම විද්‍යුත් සඟරාවේ මූලික අරමුණ වනුයේ ද අපගේ විෂය සම්බන්ධයෙන් කතිකාවතක්,සාහිත්‍යයක් ගොඩනැගීම හා ඒ සඳහා විකල්ප හඳුනා ගැනීම වේ. පොදු ගැටලුවක් ලෙස දිස්වන මෙම අර්බුදයේ උප සංස්කෘතීන්, විවිධ රටවල් ගැටලුව කෙරෙහි දැක්වූ ආකල්පමය ප්‍රවනතා හා විසඳුම්, සෞන්දර්යාත්මක සහ ආගමික ප්‍රවේශ පිළිබඳ සුලුවෙන් වුව ද පිවිසුමක් ලෙස මෙහි අන්තර්ගතය සඳහන් කළ හැක.

**කතෘ මණ්ඩලය**

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිනියගේ පණිවිඩය



අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ දූෂණ නිවාරණ අංශයේ මෙහෙයවීමෙන් පළ කෙරෙන සය මාසික විද්‍යුත් සඟරාවේ මංගල කලාපයට සුභාශිංසන පිරිනමන්නේ අතිශය සතුටිනි.

වත්මන් ශ්‍රී ලංකාවෙන් අල්ලස හා දූෂණය තුරන් කරමින් සුපිළිපන්න දේශයක් කරා යන ගමනේ දී නූතන තාක්ෂණික නවමු අත්දැකීම් භාවිතා කරමින් මෙවන් ආකාරයක විද්‍යුත් සඟරාවක් එළි දැක්වීම අතිශය කාලෝචිත බව ද සඳහන් කර සිටිමි.

මෙම සඟරාව සය මාසිකව යාවත්කාලීනව නේක විධි දැනුම් සම්භාරයක් ජනගත කිරීමට හැකිවේවායි ප්‍රාර්ථනා කරමි.

**එස්. ඊවා වනසුන්දර**
**විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු**
**සභාපති**
**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කොමසාරිස් 11 තුමියගේ පණිවිඩය



ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීමේ පරමාර්ථය සහිතව ස්ථාපිත කරන ලද දූෂණ නිවාරණ අංශය මගින් සුපිළිපන්න දේශයක ඒකායන පැතුම මල්ඵල ගැන්වීමේ අරමුණින් එළිදක්වන්නට යෙදෙන විද්‍යුත් සඟරාවේ මංගල කලාපයට සුභාශිංසන එක් කිරීමට ලැබීම මා ලද භාග්‍යකි.

නවීන විද්‍යුත් මාධ්‍යයන් යොදාගනිමින් දූෂණ විරෝධී සංකල්පය ජනගත කරමින්, නවමු අදහස් යෝජනා සය මාසිකව සඟරාවක් ලෙස ප්‍රජාව අතරට ගෙනයාමට හැකිවීම සුපිළිපන් දේශයක් කරා යන ගමන් මාර්ගයේ සාර්ථක පියවරක් වනු ඇති.

එහෙයින් මෙම "සුපිළිපන් ද්වාරයට" තවදුරටත් නේක විධ ජනයාගේ සුපිළිපන් දැත් ශක්තිමත් කිරීමට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**දීපාලී විජේසුන්දර**
**විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු**
**කොමසාරිස් 11**
**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කොමසාරිස් 111 තුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකාවෙන් අල්ලස හා දූෂණය තුරන් කිරීමේ අභිප්‍රාය මුදුන් පමුණුවා ගැනීමේ තවත් එක් පියවරක් ලෙස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිවාරණ අංශය මගින් සය මාසිකව එළි දැක්වීමට අපේක්ෂිත විද්‍යුත් සඟරාවේ මංගල කලාපයට සුභාසිංශන එක් කිරීමට ලැබීම  අප ලද භාග්‍යයකි.

සුපිළිපන්න ශ්‍රී ලංකාවක් කරා යන ගමනේ දී විවිධ ක්‍රමෝපායන් යොදා ගෙන දූෂණ විරෝධී සංකල්පයන් ජනගත කිරීමට විද්‍යුත් මාධ්‍යය යොදා ගෙන කෙරෙන මෙවන් සංකල්පයන් අතිශය කාලෝචිතය.

එහෙයින් මෙම සඟරාව සය මාසිකව යාවත්කාලීන වෙමින් නේක විධ දැනුම් සම්භාරයන් සමාජගත කරමින් ශ්‍රී ලංකාවෙන් අල්ලස හා දූෂණය තුරන් කිරීමට යෝධ පියවරක් වේවා යි සුභ ප්‍රාර්ථනා කරමි.

**චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ**
**විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති**
**කොමසාරිස් 111**
**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

අල්ලස සහ දූෂණය මෙරටින් තුරන් කර දැමීම පිණිස සකස් කරන ලද ජාතික ක්‍රියාකාරී සැලැස්මට අනුගතවීමක් වශයෙන් පිහිටුවන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ දූෂණ නිවාරණ අංශයෙහි මෙහෙයවීමෙන් එළිදක්වනු ලබන සයමාසික විද්‍යුත් සඟරාවෙහි මංගල කලාපයට මාගේ සුභ පැතුම් එක් කරමි.

නවීන තාක්ෂණය භාවිතයෙන් වත්මන් තොරතුරු, යුගයට ගැලපෙන පරිදි අවම පිරිවැයක් යටතේ මෙවන් ආකාරයට විද්‍යුත් සඟරාවක් ඉදිරිපත් කිරීමට දූෂණ නිවාරණ අංශය කටයුතු කිරීම ඉතාමත් කාලෝචිත බව මා විශ්වාස කරන අතරම ඒ පිලිබඳව මාගේ හෘදයාංගම ස්තූතිය දූෂණ නිවාරණ අංශය වෙත පිරිනමමි. තවද මෙම විද්‍යුත් සඟරාව සාර්ථක කරගැනීමට ලිපි නිර්මාණ යොමුකිරීමෙන් සහය වූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අනෙකුත් අංශවල නිලධාරීන් වෙත ද ස්තූතිය පළ කරමි.

යාවත්කාලීන කරන ලද දැනුම් සම්භාරයක් සමඟින් මෙම විද්‍යුත් සඟරාව වඩාත් අර්ථාන්විතව සයමාසිකව ඉදිරිපත් කිරීමටත්, මෙවන් වූ නිර්මාණාත්මක නිවාරණ ක්‍රමවේදයන් තවදුරටත් ක්‍රියාත්මක කිරීමටත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ දූෂණ නිවාරණ අංශයට හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කර සිටිමි.

**ඩබ්.කේ.ඩී. විජේරත්න**
**අධ්‍යක්ෂ ජනරාල්**
**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ලේකම්තුමියගේ පණිවිඩය



අල්ලස හා දූෂණය මෙරට සමස්ත රාජ්‍ය දේහය හා සමාජය පුරා පැතිර ගොස් තිබෙන පසුබිමක, සුපිළිපන්න රාජ්‍ය සේවයක් බිහිකිරීමට වෙර දැරීමද අභියෝගාත්මකය.

එවන් වටපිටාවක, දෙසැම්බර් 09 දිනයට යෙදෙන ජාත්‍යන්තර දූෂණ විරෝධී දිනයද සමරමින්, මෙරට රාජ්‍ය සේවය තුළ සුපිළිපන්න රාජ්‍ය සේවකයකු හා රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම පිණිස දරන්නාවූ වෑයම අතිශයින් අගය කළ යුතුමය.

එලෙස, දූෂණ විරෝධි දිනයද සමරමින් එළිදක්වන සුපිළිපන් ද්වාරය විද්‍යුත් සඟරාව සුපිළිපන්න රාජ්‍ය සේවයක් බිහිකිරීම උදෙසා වන භාෂාත්මක ප්‍රවේශයක් වනු ඇත.
මෙම කාර්යය අඛණ්ඩව පවත්වාගෙන යෑමට මාගේ ශුභාශිංසනද මෙසේ පිරිනමමි.

**අප්සරා කල්දේරා**
**කොමිෂන් සභා ලේකම්**

## උපදේශන සංස්කාරකතුමියගේ පණිවිඩය



අයිතිවාසිකම් වෙනුවට, යුතුකම හා වගකීම පිළිබඳ මනා වූ අවබෝධයකින් යුතුව, දැඩි කැපවීමෙන් හා අප්‍රතිහත ධෛර්යයෙන් එළිදක්වන්නට යෙදුණු "සුපිළිපන් ද්වාරය" උදෙසා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිවාරණ අංශය ප්‍රමුඛ ඔබ සැම දැක් වූ දායකත්වය මහත් ගෞරවයෙන් සිහිපත් කරන අතර, මාගේ හෘදයාංගම සුභාශිංසන මෙසේ පිරිනමමි.

දඬුවමට ඇති බිය නිසා වරදින් වැලකී සිටීමෙන් ඔබ්බට ගොස්, සුපිළිපන් රසය හා එහි මහිමය වටහාගත් අභිමානවත් පරපුරක් බිහි කිරීමෙහිලා සුපිළිපන් ද්වාරයෙන් එළිදැක්වෙන නිර්මාණ දායක වනු ඇතැයි විශ්වාස කරමි.


**රුවිනි වික්‍රමසිංහ**
**උපදේශන සංස්කාරක**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

# පටුන


| | | |
|---|---|---|
| 1 | දෙසැම්බර් 9 වන දිනට යෙදෙන ජාත්‍යන්තර දූෂණ විරෝධී දිනය අදයි | 01 |
| 2 | මා දුටු අසිරිමත් දකුණු කොරියාව | 02 |
| 3 | මුර බල්ලා බැඳ දැම්මාද? | 04 |
| 4 | "දූෂණ නිවාරණ නිලධාරියා" අන්තර්ජාතික සංකල්පයක් ලෙස | 05 |
| 5 | අල්ලස හා දූෂණය මනෝවිද්‍යාත්මක ඇසින් | 06 |
| 6 | දූෂණ වරදක් සැකවින් හැඳින්වීම | 08 |
| 7 | අල්ලස් කොමිසමට පැමිණිලි කරන්න අලුත් ක්‍රමයක්... | 09 |
| 8 | අල්ලස සහ දූෂණය මර්දනයට තාක්ෂණයේ වර්ධනය සහායට | 10 |
| 9 | අපරාධ අධිකරණයේ දිග හැරෙන අතීත මතක සහ යුක්තිය | 12 |
| 10 | අල්ලස දූෂණය සම්බුද්ධ ධර්මය ඇසුරින් | 14 |
| 11 | අල්ලස දූෂණය නැති කිරීමට නීති අණපනත් වලින් ඔබ්බට මානුෂීය ආකල්ප මිනිසා තුළ ස්ථාපිත කිරීම සිද්ධ කළ යුතු ය | 16 |
| 12 | මෙඩූසාට පෙම් කරමුද? | 18 |
| 13 | පන්හිඳ | 20 |

# දෙසැම්බර් 9 වන දිනට යෙදෙන ජාත්‍යන්තර දූෂණ විරෝධී දිනය අදයි

ඉෂානි විජේසූරිය
දූෂණ නිවාරණ නිලධාරී
දූෂණ නිවාරණ අංශය




2003 ඔක්තෝබර් 31 වන දින මහා මණ්ඩලය විසින් දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සම්මත කළ අතර එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC) එතැන් සිට සම්මුතියේ පාර්ශවකරුවන්ගේ සම්මේලනයේ ලේකම් කාර්යාලය ලෙස නම් කර ඇත (58/4 යෝජනාව). අල්ලස හා දූෂණයට එරෙහිව තනි තනිව කටයුතු කළ නොහැකි බව අවබෝධ කර ගනිමින් ලෝකයේ රටවල් 186 කට වැඩි ප්‍රමාණයක් එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී සම්මුතියට අත්සන් තබා තිබෙන අතර ශ්‍රී ලාංකිකයින් ලෙස අප ද 2004 වසරේදී මෙම සම්මුතියට එකඟත්වය පළ කරමින් ඊට අත්සන් තබා ඇති බව බොහෝ දෙනා නොදන්නා කරුණක් විය හැකිය. මෙම ප්‍රඥප්තිය අත්සන් කළ රටවල් අතරින් ශ්‍රී ලංකාව ආසියානු කලාපයේ ප්‍රථමයාවන අතර ලෝක මට්ටමින් ඊට එකඟතාවය පලකළ දෙවැනි රට බවට ද පත් විය.[1]

ඒ අනුව, දූෂණය පිළිබඳ දැනුවත් කිරීම, එයට එරෙහිව සටන් කිරීම සහ දූෂණය වැලැක්වීම සඳහා සම්මුතියේ කාර්යයභාරය පිළිබඳ දැනුවත් කිරීම යන කරුණු කාරණා සඳහා දෙසැම්බර් 9 වන දින ජාත්‍යන්තර දූෂණ විරෝධී දිනය[1] ලෙස නම් කරන ලද අතර එදා පටන් අද දක්වා සෑම වසරකම දෙසැම්බර් 9 වන දින ලොව පුරා ජනතාව එකාමෙන් එක්රොක්ව දූෂණ විරෝධී දිනය සමරමින් දූෂණය නැමැති රුදුරු රකුසාගෙන් ආරක්ෂා වීම සඳහාත් දූෂණයෙන් තොර අසිරිමත් ලොවක් බිහි කිරීම සඳහාත් තම දායකත්වය සපයමින් සිටී.

අල්ලස හා දූෂණය මුළු ලොවටම ඉතා ප්‍රබල තර්ජනයක් වී ඇති අවදියක ඊට එරෙහිව තනි තනිව නැගී සිටීම අප සියලුදෙනාගේම ප්‍රථම රාජකාරිය කර ගැනීම ඉතා වැදගත් කරුණක් බව නොරහසකි. රටක සංවර්ධනයට, ආයෝජනවලට, වෙළඳාමට, කීර්තිනාමයට, සමාජ සාධාරණත්වයට බොහෝ බලපෑම් ඇති කරන දූෂණය පිටු දැකීම සඳහා අනෙකුත් රටවල් හා සමගාමීව දූෂණයට එරෙහිව හඬ අවදි කිරීම තුළින් නූපන් දරුවන්ගේ හෙට දිනය ඒකාලෝක කිරීමේ මාහැඟි කාර්යයට දායක වීමට අප සැමට හැකිවනු ඇත.

අල්ලස දූෂණය තුරන් කිරීම කළ නොහැක්කක් බවට බොහෝදෙනා මත පළ කරන අවදියක, ගලා යන දිය පහර ප්‍රයෝජනයට ගනිමින් උඩුගම් බලා පිහිනා යන සැමන් මත්සයින් සේ බුද්ධිමත්ව කටයුතු කරමින් එකමුතුවෙන් ක්‍රියා කිරීම තුළින් අප රටින් දූෂණයෙහි අඳුරු වළාපටල මකා දැමීමට අප සැමට හැකිවනු ඇත.

ඉදින්, ජාත්‍යන්තර දූෂණ දිනය දා ශ්‍රී ලාංකික අපගේ වගකීම නොපිරිහෙලා ඉටු කරමින් ලෝකය ඉදිරියේ ලක්මාතාව සුපිළිපන් දේශයක් ලෙස අභිසෙස් ගැන්වීමෙහිලා අවශ්‍ය කටයුතු සිදු කිරීමට එක් සිතින් පෙළ ගැසීමට අවසරයි.

1 United Nations. (2022). International Anti-Corruption Day. https://www.un.org/en/observances/anti-corruption-day



# මා දුටු අසිරිමත් දකුණු කොරියාව

සුභාෂිණී සිරිවර්ධන
සහකාර අධ්‍යක්ෂ ජනරාල්





ශ්‍රී ට දශක කිහිපයකට පෙර "කොරියාව" යන වචනය හා බැඳී පැවතියේ එකිනෙකට යාබදව තැනූ ටකරන් මඩුවලින් හෙබි අපිරිසිදු කුඩා පේළි ගෙවල් සමුදායකි. දරිද්‍රතාවයේ පතුළටම වැටී ජීවිතය සරිකර ගැනීම සඳහා සමාජ නීතිරීති තුළින් රිංගා යමින්, සාර්ථකත්වයේ පළිඟු සොයන මානව ජන කොටසක් ද එහි විය. පසු කාලීනව " සුජාත දියණි", "Boys Over Flowers" වැනි සොඳුරු ටෙලි සිත්තම් තුළින් තරුණ තරුණියන් තම ප්‍රේමය රහසේ ප්‍රකාශ කළ "ගුජුම්පියෝ", "ජීහු" වැනි චරිත ආලින්දයට පැමිණියේත් කොරියානු ජන සංස්කෘතිය තුළිනි. අද වන විට විදේශීය ශ්‍රම ගලනයේ ප්‍රචලිත දේශයක් වී ඇත්තේ ද දකුණු කොරියාවයි.

චීන, රුසියානු දේශ මායිමත්, ජපානයත් අතරමැදිව පිහිටා ඇති දකුණු කොරියාව මිලියන 50ක ජනගහනයක් වර්ග කිලෝමීටර් 99678 භූමි ප්‍රමාණයක් දරයි. "සෝල්" තම අගනගරය කරගනිමින් ඍතු හතරක දේශගුණ වෙනස්කම්වලට මුහුණ දෙයි. මේ එකඳු කරුණක්වත් මම අසිරියක් ලෙස නොසලකමි. දූෂණයට එරෙහි පුරවැසි දායකත්වය, දේශපාලන අභිලාශය හා ශක්තිමත් දූෂණ නිවාරණ ක්‍රමවේද හා ආයතනයන් සැබැවින්ම දකුණු කොරියාව සතු අසිරියකි. කුහුඹුවන් සේ කඩිමුඩියේ වීදි පුරා යන එන එපුර වැසියනුත් කඩ සල්පිල් පුරවා ඇති පාරිභෝගික භාණ්ඩත් එකිනෙකට ස්වායක්තව පවතින අපූරුව දුටු මා මනසට එක්වරම ඇදී එන්නේ පිටකොටුව හරස් වීදි පුරා කෑකෝ ගසමින් වෙළදාම් කිරීමටත්, තම විකුණුම් භාණ්ඩ පරිස්සම් කරගැනීමටත් උත්සාහ ගන්නා වෙළෙන්දන්ය. සුපිළිපන්නභාවය සිය රාජ්‍ය ප්‍රතිපත්තියේ මූලික අංගය කොටගත් දකුණු කොරියාවේ දූෂණ නිවාරණ යාන්ත්‍රණය ප්‍රශංසනීයයි.

ජෝසෙන් අධිරාජ්‍යයේ බිඳ වැටීමත් සමඟම ජපාන පාලනයට නතුවන කොරියාව 1945 වර්ෂයේදී නිදහස ලබාගනී. ඒකීය රාජ්‍යයක්ව පැවතියත් 1950-1953 අතර දේශසීමා මත ඇතිවන යුද්ධය හේතුවෙන් උතුරු සහ දකුණු කොරියාව වෙනමම රාජ්‍යයන් දෙකක් බවට පත්වේ. යුද්ධයෙන් පසුව ඇතිවන ආර්ථික, සමාජයීය සහ දේශපාලන නැගිටීමේ මූලික හර පද්ධතිය වී ඇත්තේ සුපිළිපන්නභාවය, විනිවිදභාවය සහ වගවීම වැනි අප හොඳින් දන්නා එහෙත් ක්‍රියාත්මක කරවීමේ අපහසුතා ඇති සංකල්පයන්ය.

වර්ෂ 2003 දී ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය නිලධාරීන්ගේ හැසිරීම සඳහා වන ජනාධිපති ප්‍රඥප්තිය (Code of Conduct for Public Officials) එරට රාජ්‍ය නිලධාරීන්ගේ අභිමානයයි. වර්ෂ 2008 දී දූෂණ නිවාරණය සහ "දූෂණ විරෝධී සහ සිවිල් අයිතිවාසිකම් කොමිසම" සංස්ථාපනය සඳහා පනවන ලද නීතිය එරට දේශපාලන අභිලාශයේ ගමන් මග මොනවට පිළිබිඹු කරවයි. මෙම දූෂණ විරෝධී සහ සිවිල් අයිතිවාසිකම් කොමිසම (Anti-corruption and Civil Right Commission) අප කොමිෂන් සභාව මෙන්ම කටයුතු කරන එරට එකම ආයතනය වේ. වර්ෂ 2011 වන විට මහජන සුභසිද්ධිය හා හඬනගන්නන්ගේ ආරක්ෂාව තර කිරීම සඳහා "හඬනගන්නන් ආරක්ෂා කිරීමේ පනත" (Public Interest Whistleblower Protection Act) බලාත්මක වීම ආරම්භවීමත් සමගම දූෂණය දුටු තැන එයට එරෙහිවීමටත්, එය නිසි තැන් බලා වාර්තා කිරීමටත් කොරියානු ජනතාව පසුබට වී නොමැත. දූෂණය සහ මහජන සුභසිද්ධිය සඳහා හඬනගන්නකු වූ හුන්ඩායි මෝටර් රථ සමාගමේ කාර්මික ඉංජිනේරුවරයෙකු වූ වැන්ග් හෝ කිම් (Gwang-ho-kim) මහතා කියා සහ හුන්ඩායි මෝටර් රථ නිෂ්පාදන සමාගම් දෙකට එරෙහිව නිෂ්පාදන දෝෂයක් සම්බන්ධයෙන් කරන ලද පැමිණිල්ල ජාත්‍යන්තර කීර්තියට පත් උදාහරණයක් ලෙස දැක්විය හැක. එහිදී අසිරිය වන්නේ එරට "දූෂණ විරෝධී සහ සිවිල් අයිතිවාසිකම් (ACRC) කොමිසම, හඬනගන්නන් ආරක්ෂා කිරීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග යි. එහි හඬනගන්නා ආරක්ෂා කිරීමට අවශ්‍ය නීති සහාය පමණක් නොව පෞද්ගලික ජීවිතය ගෙනයාමට අවශ්‍ය පහසුකම් සපයාදීමට පවා නෛතික ඉඩහසර 2011 පනත මගින් "දූෂණ විරෝධී සහ සිවිල් අයිතිවාසිකම් කොමිසම වෙත ලබාදී ඇත. වර්ෂ 2015 අංක 04 දරණ පනතින් අප රට තුළද අපරාධ වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂාව සඳහා සාධනීය පියවර ගෙන තිබුන ද දකුණු කොරියානු නීති පද්ධතිය තුල හඬනග න්නකු වෙත ලැබෙන රැකවරණය මෙන් රැකවරණයක් ලබාදීමට හැකියාවක් නොමැති බව පිළිගත යුතු කරුණකි. සැබැවින්ම එරට හඬනගන්නන් ආරක්ෂා කිරීමේ නීති පද්ධතිය හා යාන්ත්‍රණය අසිරියකි.

වර්ෂ 2016 දී අයථා මුදල් ඉල්ලීම් (Improper Solicitation and Graft Act) සම්බන්ධ පනතත් 2020 වසරේදී අයථා ලාභ නැවත අත්පත් කර ගැනීම (Act on Prohibition of False claims for Public Funds and



Recovery of Illicit Profits) සඳහා වන පනතත් දකුණු කොරියානු දූෂණ විරෝධී යාන්ත්‍රණය තුල ක්‍රමික වර්ධනය පෙන්නුම් කරයි. බැඳියාවක් අතර ගැටුම් වලකාලීම සඳහා 2022 වසරේ දී සම්මත කරගන්නා ලද රාජ්‍ය නිලධාරීන්ගේ රාජකාරිමය කටයුතුවලදී බැඳියාවක් අතර ගැටුම් වලකාලීමේ පනත (Act on the Prevention of Conflict of Interest Related to Duties of Public Officials) මගින් එරට රාජ්‍ය සේවකයා වෙත තම රාජකාරියත් පෞද්ගලික ගනුදෙනුත් විනිවිදභාවයකින් යුතුව ඉදිරියේදී විය හැකි යැයි සිතිය හැකි ගැටුමකින් හෝ තොරව පවත්වාගෙන යාමේ මාර්ගෝපදේශ ලබාදී ඇත. බැඳියාවන් අතර ගැටුම් වලක්වාලීමේ මාර්ගෝපදේශ පද්ධතියක් සංගෘහිත කොට එය ජනගත කරවීම සඳහා පාරමී දම් පුරන අපට දකුණු කොරියාව සැබැවින්ම අසිරියකි.

රටක අභිමානය එරට සුපිළිපන්න ජනතාවයි. දූෂණය තුරන් කරවීම එක් දේශපාලන අධිකාරියක හෝ ආයතනයක වගකීමක් පමණක් නොවන බව දකුණු කොරියාව තුල මා ගත කළ කෙටි කාලය තුළ උගත්තෙමි. එය සැබැවින්ම අසිරියකි.



# මුර බල්ලා බැඳ දැම්මාද?

යූ. පී. විජයහේවා
අභ්‍යන්තර විගණක
විගණන අංශය

1896 වසර විගණන ක්ෂේත්‍රයට සුවිශේෂී වසරක් වනු ඇති බව එදා උන් කිසිවකුත් නොසිතන්නට ඇත. එම වසරේ එක් සාමාන්‍ය දිනයක එංගලන්ත අභියාචනාධිකරණය, විගණකවරයකුගේ කාර්යභාරය සම්බන්ධයෙන් ඉතා සුවිශේෂී තීන්දුවක් ලබා දෙන ලදී. කිංග ස්ටන් කොටන් මිල් පුද්ගලික සමාගම තම විගණකවරුන්ට එදිරිව පවරා තිබූ නඩුවේ තීන්දුව සම්බන්ධයෙන් වූ අභියාචනය සලකා බලමින් එංගලන්ත අභියාචනාධිකරණ විනිසුරු ලින්ඩ් විනිශ්චකාරතුමා විගණකවරයෙකු ගේ කාර්යභාරය නිර්වචනය කරමින් ප්‍රකාශ කරන ලද්දේ විගණක යනු මුර බල්ලකු මිස දඩ බල්ලකු නොවන බවය.[1]

මෙය විගණකවරයෙකු ගේ කාර්යභාරය සම්බන්ධයෙන් එදා මෙදාතුර ලබාදුන් වඩාත් උචිත උදාහරණයක් ලෙස හැඳින්වීම වරදක් නොවේ. මුර බල්ලා කිසිවිටකත් සුරතලකු නොවේ. නමුත් දඩ බල්ලකු මෙන් සපා කන්නේ නැත. හෙතෙම ඉතා සියුම් ශබ්දය පවා අවධානයට ගනිමින් කන් යොමා සිටින අතර කිසියම් අසාමාන්‍යතාවක් දුටු සැනින් ඉව කරමින් දිගින් දිගටම පරීක්ෂා කරනු ලබයි. ඇවැසි සෑම විටකදී ම බුරමින් තම ස්වාමීන්ගේ අවධානය ඒ වෙත ලබාදීමට හා දැනුවත් කිරීමට උත්සුක වේ. මුර බල්ලකු සපා කන්නේ නොකරම බැරි අවස්ථාවක දී පමණි.

මෙම මුර බල්ලන් පෙනෙන්නට බැරි පිරිසක් ද ඇත. ඉන් ප්‍රධානතම පාර්ශ්වය වන්නේ සොරකමට ලැදියාවක් දක්වනවුන් ය. ඔවුනට තම වංචනික ක්‍රියාවලිය කරගෙන යාමට ඇති විශාලතම බාධාව වන්නේ මුර බල්ලන් ය. එමෙන්ම නිදා සිටින මුරකරුවන්ට ද, සොරුන්ට සහය වන්නනට ද, මුර බල්ලන් දෘෂ්ටිගෝචර නැත. එනිසාම ඇතැම්හු මුර බල්ලන් මරා දැමීමට උත්සාහ කරන අතර සොරකමට ප්‍රිය කරන්නන්ගේ උසිගැන්වීම මත ඇතැම්විට හිමිකරුවන් ම තම මුර බල්ලන් බැඳ දැමීමට තරම් අනුවණ වන අවස්ථා ද දක්නට ලැබේ.

මෙලෙස බැලූ කල යථෝක්ත කියමන ප්‍රකාශ කර මේ වන විට වසර එකසිය විස්සකට වඩා කල් ගත වී තිබුණ ද එහි ප්‍රායෝගික වලංගුභාවය අබ මල් රේණුවකිනුදු වියැකී ගොස් නැත. සෑම රටකම පාහේ රාජ්‍ය මූල්‍ය කටයුතු වල විනිවිදභාවය සහ ගිණුම් කටයුතුභාවය ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සුවිශේෂී කාර්යභාරයක්, රාජ්‍ය විගණනය මගින් ඉටු කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි ව්‍යවස්ථාව සහ 2018 වසරේ දී සම්මත වූ අංක 19 දරන ජාතික විගණන පනත මගින්, රජයේ ගිණුම් කටයුතු විගණනය සම්බන්ධ වගකීම පවරා ඇත්තේ විගණකාධිපතිවරයා වෙතය. ඒ අනුව විගණකාධිපතිවරයා විසින් ඒකාබද්ධ අරමුදලින් කරනු ලබන වියදම් පිළිබඳව සහ රැස් කරනු ලබන ආදායම් පිළිබඳව විගණනය සිදුකරනු ලබයි. රාජ්‍ය ආයතන විසින් තම කර්තව්‍යය ඉටුකිරීමේ දී දක්වන කාර්යක්ෂමතාවය හා ඵලදායීභාවය පිළිබඳව ඇගයීම පිණිස කාර්යසාධන විගණනය, පාරිසරික විගණනය, තාක්ෂණික විගණනය, වැනි නව විගණන ප්‍රවේශයන් හඳුන්වාදීම නව විගණන පණතේ දක්නට ලැබෙන සාධනීය ලක්ෂණ ලෙස පෙන්වාදිය හැක.

1 Kingston Cotton Mill Company (No.2) (1896) Lindley L.J., Lopes L.J. and Kay L.J. (Court of Appeal)




කෙසේ වුව ද විගණන කටයුතු සිදු කිරීමේ දී විගණන කාර්යමණ්ඩලවලට ප්‍රායෝගික ගැටළු රැසකට මුහුණදීමට සිදුවන අවස්ථා දක්නට ලැබෙන අතර විගණනය කිරීමට ගොස් නිලධාරීන් ජීවිතයෙන් වන්දිගෙවූ අමිහිරි අවස්ථා ද මෑතකාලීන ලක් ඉතිහාසයේ නැත්තේම නොවේ. බොහෝ විට විගණකයන් තම විගණන කටයුතු සඳහා තොරතුරු ඉල්ලීමේ දී, බහුතරයක් ආයතන ප්‍රධානීන් ඉතා නම්‍යශීලීව කටයුතු කළ ද ඇතැම් පාර්ශවයන් එය විශාල හිසරදයක් ලෙස සලකා කටයුතු කරන අතර ඇතැම්හු විගණකයන් තම රාජකාරියට අනවශ්‍ය අතපෙවීමක් සිදුකරන බව සිතා ක්‍රියා කරනු දක්නට ලැබේ. මේ හේතුවෙන් සත්‍ය හා සාධාරණ විගණනයක් කිරීම ඉතා අපහසු කාර්යයක් බව ට පත් වී ඇතිබව විගණන කාර්යමණ්ඩල අදහස වේ.

රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳව ඉතා උනන්දුවකින් සාකච්ඡාවට භාජනය කරන්නා වූ මෙවන් වකවානුවක විගණනය අත්‍යවශ්‍ය සාධකයක් වන අතර විගණනය දෙස සතුරු ආකල්පයකින් නොබලා විගණනය රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් වංචා සහ දූෂණය වැළැක්වීමට ඇති වඩාත් ප්‍රබල නිවාරණ අවියක් ලෙස සලකා කටයුතු කිරීම වඩාත්



Photo: Michael Fleshman https://flic.kr/p/eJrGgh CC BY-NC 2.0

# 'දූෂණ නිවාරණ නිලධාරියා' අන්තර්ජාතික සංකල්පයක් ලෙස

J.L.A.උදේශිකා මධුභාෂණී
දූෂණ නිවාරණ නිලධාරී
දූෂණ නිවාරණ අංශය

"දූෂණ නිවාරණ නිලධාරියා" යන සංකල්පය ලංකාවට මෑත කාලීනව එක් වුණ සංකල්පයක් වුව ද එය වසර ගණනාවක් පුරාවට අන්තර්ජාතික වශයෙන් පිළිගැනීමට ලක්ව ඇත්තාක් මෙන් ම දැනට රටවල් ගණනාවකම ක්‍රියාත්මක වන සංකල්පයකි.

යුරෝපීය රටක් වන ඉතාලියේ ජාතික දූෂණ විරෝධී අධිකාරිය (ANAC) විසින් 2012 දී පිහිටුවන ලද 'දූෂණ විරෝධී නීතිය' (රාජ්‍ය පරිපාලනයේ දූෂණ සහ නීති විරෝධී ක්‍රියාකාරකම් වැළැක්වීම සහ ඒවාට එරෙහිව සටන් කිරීම පිළිබඳ නීතිය අංක 190/2012) අනුව සෑම රාජ්‍ය ආයතනයක ම දූෂණ නිවාරණයට කැපවූ දූෂණ නිවාරණ නිලධාරියෙකු එනම් "විනිවිදභාවය සහ දූෂණ වැළැක්වීම සඳහා වගකිව යුතු නිලධාරියකු (RPTC)" හඳුන්වා දී ඇත. 2016-2021 මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ (UNODC) වාර්තාවෙහි මෙහි සාර්ථකත්වය විග්‍රහ කොට දක්වා ඇත. මෙහිදී RPCT නිලධාරීන්ගේ ස්වාධීනත්වය සහතික කිරීම සඳහා දේශපාලඥයින්ගේ අනිසි බලපෑම් වලින් ඔවුන්ට ආරක්ෂණයක් පැවතිය යුතු අතර ඔවුන් අන් නිලධාරීන්ට වඩා පිළිගැනීමෙන් හා වැටුපෙන් සමාජයේ ඉහළ මට්ටමක තැබිය යුතු බව සඳහන් වේ.[1] දැනට මෙහි නිලධාරීන් 5000කට ආසන්න සංඛ්‍යාවක් ඇතුළත් වන අතර RPCT ජාලය තුළ පරිචයන් හුවමාරු කර ගැනීමට සහ RPTC නිලධාරීන් සඳහා කැප වූ විනිවිදබාවය සඳහා පොදු දිනයක් සඳහා තවදුරටත් සහාය වීම සඳහා ANAC විසින් FORUM RPCT නමින් සමාජ සහයෝගීතා වේදිකාවක් දියත් කරන ලදී.

ඇමරිකා එක්සත් ජනපදයේ වංචා හා දූෂණයට එරෙහිව යුක්තිය හඹා යෑම සඳහා එරට රහස් ඔත්තු සේවය සමග කටයුතු කරන Whistle Blowers ලෙස හඳුන්වන්නේ ද මෙම නිවාරණ නිලධාරින් ම වේ.[2] ලකුණු 67ක් සමගින්, 2012 සිට 2022 වන විට එක්සත් ජනපදයේ ප්‍රාන්ත ලෝකයේ දූෂණ සංජානන දර්ශකයේ (CPI) පහළම ස්ථානයට ළඟා වී ඇත. එනම්, දූෂණය තුරන් කිරීමට නිවාරණ සංකල්පය සාධනීය වෙනසකට හේතුවක් වී ඇති බවයි.[3]

එමෙන්ම නැගෙනහිර ආසියාතික රටක් වන හොංකොංහි දූෂණ නිවාරණ උපදේශන කමිටුව (CPAC) යටතේ දූෂණ නිවාරණ දෙපාර්තමේන්තුවක් (CPD) ස්ථාපනය කොට ඇති අතර සෑම පොලිස් කලාපයක ම දිස්ත්‍රික් පොලිස් ස්ථාන පදනම් කරගත් අපරාධ නිවාරණ නිලධාරීන් මෙන් ම එම කලාපයේ අපරාධ වැළැක්වීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ වගකීම දරන ප්‍රාදේශීය අපරාධ වැළැක්වීමේ නිලධාරියෙකු (RCPO) බලාත්මක කර ඇත. ඔවුන් අපරාධ වින්දිතයන් හෝ අපරාධවලින් වඩාත් අවදානමට ලක්ව සිටින අය වෙත උපදෙස් ලබා දීමට හෝ ආරක්ෂක සමීක්ෂණ සිදු කරයි.[4] මෙහි ප්‍රතිඵලයක් ලෙස හොංකොං රාජ්‍ය 2019 දී දූෂණ සංජානන දර්ශකයේ (CPI) 16 සිට 2020 වසරේදී 11 වන ස්ථානය කරා ඉදිරියට පැමිණ ඇත. පෙර මෙය දූෂණය අතින් පිරිහුණු රාජ්‍යක් ලෙස සලකනු ලැබූ නමුත්, මෑත දශක කිහිපය තුළ හොංකොං රාජ්‍ය දූෂණ සංජානන දර්ශකයේ (CPI) ඉහළ ස්ථානයක් හිමි කරගත් රාජ්‍යක් බවට පත්ව ඇත.

අප්‍රිකානු මහද්වීපයේ මුරිසි රාජ්‍ය තුළ ද දූෂණයට එරෙහි ස්වාධීන කොමිෂන් සභාවක් ස්ථාපිතව ඇති අතර එහි දූෂණ නිවාරණ හා අධ්‍යාපන අංශය තුළ දූෂණ නිවාරණ නිලධාරින් පත් කොට ඇත. ඔවුන්ගේ කාර්යභාර්ය වන්නේ දූෂිතයන්ට එරෙහිව මහජනතාව දැනුවත් කිරීම සහ දූෂණයෙන් වැළකීම සඳහා දේශන, සහ සම්මන්ත්‍රණ සකස් කිරීම සහ පැවැත්වීම, දූෂණයේ අන්තරායන් පිළිබඳ මහජන උද්ඝෝෂණ පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම, දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා මහජන සහයෝගය පෝෂණය කිරීම සහ දූෂණය පිටුදැකීම සඳහා දැනුවත් කිරීම සඳහා සන්නිවේදන ද්‍රව්‍ය සකස් කිරීම සහ ඒවා බෙදා හැරීම සහතික කිරීම, අවංකබාවය සහ අඛණ්ඩතාව වැනි සාරධර්ම ශක්තිමත් කිරීම පිළිබඳව දරුවන් සහ තරුණයින් දැනුවත් කිරීම, මහජනතාවට පැමිණිලි සහ විමසීම් නාලිකා සන්නිවේදනය කිරීම, කොමිෂන් සභාවේ කාර්යභාරය මහජනතාවට පැහැදිලි කිරීම සහ දූෂණයට එරෙහි සටනට සහය දිය යුතු බව මහජනතාවට ඒත්තු ගැන්වීම හා දූෂණ විරෝධී සාකච්ඡා, දේශන, සම්මන්ත්‍රණ සහ ජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාරවල ප්‍රතිඵල පිළිබඳ වාර්තාව සකස් කිරීම වේ.[5]

නවසීලන්තයේ වංචා හඳුනා ගැනීම සහ වැළැක්වීම සඳහා බරපතල වංචා කාර්යාලයක් (SFO) පිහිටුවා ඇති අතර මින් Covid-19 හදිසි සහන අරමුදල් වංචාවේ අවදානම අවම කිරීමට රාජ්‍ය අංශයට උපකාර කිරීම සඳහා මාර්ගෝපදේශ, දැනුවත් කිරීම සහ හැකියාව ගොඩනැගීම සඳහා සහාය වීම සිදු කරනු ලබයි.[6] එමෙන්ම නවසීලන්තය දූෂණ සංජානන දර්ශකයේ (CPI) ඉහළම අගයක් දරා සිටියි.

ජැමෙයිකාවේ සුපිළිපන්න කොමිෂන් සභාව යටතේ දූෂණ නිවාරණ නිලධාරින් පත් කොට ඇති අතර ඔවුන් ජැමෙයිකාවේ රජයේ ආයතන තුළ දූෂණ ක්‍රියාවලීන් පිළිබඳ දත්ත එක්රැස් කිරීම, විශ්ලේෂණය, දූෂණ අනාවරණය කිරීම, දූෂණය ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම, විමර්ශන අංශයේ නිලධාරීන් හා තොරතුරු සහ පැමිණිලි සම්බන්ධ කර ගැනීම හා දූෂණ වැළැක්වීම සඳහා දායක වේ.[7]

උක්ත උදාහරණ තුළින් ගම්‍ය වනුයේ, ලෝකයේ විවිධ රටවල් තුළ විවිධ නම් ඔස්සේ මෙසේ දූෂණ නිවාරණ නිලධාරීන් තම රට තුළ පවතින දූෂණය මැඩලීම උදෙසා කටයුතු කරන බවයි. එමෙන්ම එම දූෂණ නිවාරණ නිලධාරීන්ගේ පත් කිරීම හා ඔවුන්ගේ ක්‍රියාකලාපයන් සමග ම දූෂණ සංජානන දර්ශකයේ ඉදිරියට පැමිණීමට ද එම රටවල්වලට අවකාශය හිමිව ඇත. දූෂණ සංජානන දර්ශකයේ (CPI) 2021 වර්ෂයේදී 102 වන ස්ථානය හිමි කරගෙන ඇති ශ්‍රී ලංකාව පිළිබඳ සලකා බැලූ විට පෙනී යන්නේ, දූෂණ නිවාරණ නිලධාරීන්ගේ සක්‍රීය දායකත්වය රටට හිමි විය යුතු කාලය එළඹී ඇති බවයි.

1 European Commission. Anti-Fraud Knowledge Centre. pp 1-3. https://ec.europa.eu/antifraud-knowledge-centre/library-good-practices-and-case-studies/good-practices/corruption-prevention-and-transparency_en
2 The Office of the Whistleblower Ombuds. (n.d.). Whistleblower Support Organizations and Legal Resources | Office of the Whistleblower Ombuds. Retrieved December 1, 2022, from https://whistleblower.house.gov/whistleblower-support-organizations
3 the Independent Commission Against Corruption of Mauritius. November 3rd, 2020. https://www.icac.mu
4 Jamaica Integrity Commission. PP 04. file:///D:/pen%20drive%20copy/bribery%20&%20corruption%20commission/Corruption%20Prevention%20Officer.pdf
5 the Independent Commission Against Corruption of Mauritius. November 3rd, 2020. https://www.icac.mu
6 Office of the Auditor-General. Integrity and how to support it. 13 April 2021. https://oag.parliament.nz/good-practice/integrity
7 Jamaica Integrity Commission. PP 04. file:///D:/pen%20drive%20copy/bribery%20&%20corruption%20commission/Corruption%20Prevention%20Officer.pdf

මෙහි ලේඛිකාව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ දූෂණ නිවාරණ නිලධාරී උදේශිකා ජයසේකර මහත්මියයි මෙම ලිපිය ශ්‍රී ලංකා ආණ්ඩුවේ ස්ථාවරය හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ස්ථාවරය පිළිබිඹු නොවේ

# අල්ලස හා දූෂණය මනෝවිද්‍යාත්මක ඇසින්....



මනෝවිද්‍යාව සහ දූෂණය අතර වැදගත් සම්බන්ධයක් මනෝවිද්‍යා විෂය හැදෑරීමේ දී අපට දක්නට ලැබේ. නිදසුනක් වශයෙන්, දූෂණය සඳහා ප්‍රධාන සාධකයක් ලෙස මිනිසුන්ට ද්‍රව්‍යමය වශයෙන් ලබා ගත හැකි වාසින් ප්‍රවර්ධනය කරගැනීමට ඇති නිරන්තර ආශාව පෙන්වා දිය හැකි ය. තත්ත්වය එසේ වූව ද, ඒ සමඟ ම ඔවුන් සදාචාරාත්මකව ගොඩනැගුණ පුද්ගලයෙකු ලෙස සමාජයට පෙන්වා සිටීමට ද කැමැත්තක් දක්වයි. වෙනත් වචනවලින් කිවහොත්, මෙසේ දූෂිත ලෙස නම් කළ හැකි පුද්ගලයන් වූව ද අවශ්‍ය අන්තිම දෙය වන්නේ කැඩපතකින් තමන් දෙස බැලීමේ දී තමන් ශීලාචාර හා සදාචාරාත්මක පෞරුෂයකින් යුත් පුද්ගලයෙකු ලෙස ඔවුනට තමන්ව දැකීමට හැකිවීම හා තමන්ගේ හැසිරීම් සඳහා සුබවාදී නිර්වචනයක් ලබාදීමය. එය කෙසේ වූවද, ස්වයං ලාභය සහ සදාචාරාත්මක පුද්ගලයෙකු ලෙස කෙනෙකුගේ දෘෂ්ටිය පවත්වා ගැනීම අතර සමබරතාවයක් තිබිය යුතුම ය. මෙම ක්ෂේත්‍රයේ පර්යේෂකයන් එය විසඳන්නේ කෙසේ ද යන්න පිළිබඳව ඉතා උනන්දුවක් දක්වන බව අද වන විට මනෝවිද්‍යා ක්ෂේත්‍රයේ තුළ පෙනෙන්නට ඇත.

දූෂණය ආර්ථික හා සමාජ සංවර්ධනයට සැලකිය යුතු සෘණාත්මක බලපෑමක් ඇති කරයි. අල්ලස් ගැනීම නීතිවිරෝධී සහ සැඟවුණු ක්‍රියාකාරකමක් වන බැවින්, පර්යේෂණ බහුලව සිදු වූවද අල්ලස් හා දූෂණය සම්බන්ධයෙන් පුද්ගල මට්ටමින් කරන පර්යේෂණ දැඩි ලෙස අභියෝගයට හා විවේචනයන්ට ලක්වීම ද දකින්නට ඇත. පොදුවේ වංක හැසිරීම් අධ්‍යයනය කරන රසායනාගාර පරීක්ෂණ පවා අද වන විට බිහිවෙමින් පවතී. එයට හොඳ නිදසුනක් වශයෙන්, වරන්කා සහ බානික් නැමති පර්යේෂකයන් විසින් රචිත පර්යේෂණ පත්‍රිකාවේ සඳහන් කරුණු පෙන්වා දිය හැක. ඔවුන් පෙන්වා දෙන ආකාරයට අල්ලස් සම්බන්ධයෙන් පුද්ගල මට්ටමින් සිදු කරන පර්යේෂණ දැඩි අභියෝගයකට ලක් වේ. පොදුවේ වංක හැසිරීම් අධ්‍යයනය කරන රසායනාගාර පරීක්ෂණ මගින්, පර්යේෂණාත්මක ප්‍රවේශයක් භාවිතා කරමින්, සැබෑ ලෝකයේ තත්වයන්ට සමාන තත්වයන් යටතේ පුද්ගලයන්ට දූෂිත ලෙස ක්‍රියා කිරීමට (උදා: අල්ලස් ගැනීමට) ඉඩ සලසන ආකාරයෙන් නිර්මාණය කර ඇති ආදර්ශ රසායනාගාර තත්වයන් තුළ පුද්ගල හැසිරීම නිරීක්ෂණය කළ හැකි බව ඔවුන් සිදුකරන ලද පරීක්ෂණවලින් හා අනෙකුත් පර්යේෂකයන්ගේ පර්යේෂණ මගින් පෙන්වා දී ඇත. එපමණක් නොව, රසායනාගාර පරිසරයේ පාලිත ස්වභාවය පර්යේෂකයන්ට විවිධ ප්‍රතිපත්ති සහ මැදිහත්වීම් පහසුවෙන් ආදර්ශනය කිරීමට සහ අල්ලස් ගැනීමේ ව්‍යාප්තිය කෙරෙහි ඒවායේ බලපෑම නිරීක්ෂණය කිරීමට ද ඉඩ සලසා දිය හැකි බව ඔවුන්ගේ මතයයි. සියලුම රසායනාගාර අධ්‍යයනයන්, ඒවායේ කෘත්‍රිම බව නිසා විවේචනයට ලක්විය හැකි වුව ද, වර්තමාන සොයාගැනීම් සාමාන්‍යයෙන් වංකකම මෙන් ම විශේෂයෙන් ම දූෂණය පිළිබඳ රසායනාගාර අධ්‍යයනයන්හි බාහිර වලංගුභාවයට සහාය වන බව පෙන්වා දී ඇත.[1]

පර්යේෂණ හරහා තවදුරටත් පෙන්වා දී ඇත්තේ ලෝකයේ සෑම රජයකම දූෂණය ඇති බවත් එය කෙතරම් අන්ත, කෙතරම් දෘශ්‍යමාන සහ කෙතරම් ප්‍රමාණ වලින් ඉවසා සිටින්නේ ද යන කරුණු මත එම තත්වයන් රටින් රටට වෙනස් වන බවයි.[2] කෙසේ නමුත්, මෙම පර්යේෂණයන් හරහා තවත් වැදගත් සාධක සමූහයක් සම්මතයන් සහ සංස්කෘතීන් තුළ මුල් බැසගෙන ඇති බව අවධාරණය කරයි. ස්වයං සාධාරණීකරණයට අමතරව, බොහෝ අය තමන්ගේ ම ක්‍රියාවන් සඳහා "ව්‍යංග" මාර්ගෝපදේශයක් භාවිතා කරයි. විශේෂයෙන් නව, නුහුරු නුපුරුදු තත්වයන් සමඟ, සහ එම තත්වය තුළ අනෙක් පුද්ගලයින් කරන්නේ කුමක්දැයි ඔවුන් සිතනු ඇත. නිදසුනක් වශයෙන්, දූෂණ සංස්කෘතියක් තුළ, වෙනත් පුද්ගලයින් සමාන තත්වයක් තුළ කටයුතු කරන්නේ කෙසේදැයි මෙවැනි ක්‍රියාවන්ට පෙලඹීමට ප්‍රථමයෙන් සලකා බලයි.[3] නිදසුනක් වශයෙන්, මිනිසුන් තමන් සමඟ පළමුව මෙම තත්වයන් පිළිබඳ සාකච්ඡා කරයි. ඔවුන් කිසියම් පොදු වැඩක් උදෙසා රුපියල් ලක්ෂයක මුදලක් පරිත්‍යාගකර ආත්මීය වශයෙන් සැහැල්ලුවෙන් සිටීමට අවශ්‍ය කරන නිදහස ලබා ගනී. එම පුද්ගලයාම තවත් අවස්ථාවක දූෂිත ලෙස හැසිරුණත්, උදාහරණයක් වශයෙන්, අල්ලස් ලබා ගැනීමකදී වුවද, සමාජයට එම පුද්ගලයා ම විසින් සිදුකරන ලද උපකාරය පිළිබඳ ඔහු ආඩම්බරයෙන් කතා කිරීම පෙන්වා දිය හැක.

සමහර දූෂණ විරෝධී වෘත්තිකයන් කියා සිටින්නේ, මනෝවිද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින් දූෂණය පිළිබඳ පර්යේෂණ කිරීම අතිශයින් සිත්ගන්නා සුළු වුව ද, එමගින් අඩු කිරීමේ

1 Vranka, M. A., & Bahník, Š. (2018). Predictors of Bribe-Taking: The Role of Bribe Size and Personality. Frontiers in Psychology. https://www.frontiersin.org/articles/10.3389/fpsyg.2018.01511/full

2 Kirchne, L. (2017). THE PSYCHOLOGY OF BRIBERY AND CORRUPTION. Pacific Standard. https://psmag.com/news/psychology-bribery-corruption-fbi-confidential-information-cops-crime-92955



හෝ වැළැක්වීමේ අරමුණ ඉටු නොවන බවයි. නමුත්, අද වන විට මේ සඳහා බොහෝ අවස්ථාවන් දක්නට ලැබේ. උදාහරණයක් ලෙස ආයතනයක් සැලකීමෙදී, රැකියා භ්‍රමණය (job rotation) ප්‍රධාන වේ.[3] අන්තර් පුද්ගල දූෂණ ක්‍රියාවන්හි යෙදීම සඳහා විශ්වාසදායක සම්බන්ධතාවයක් වර්ධනය කර ගැනීමට මිනිසුන්ට ඇති හැකියාව මෙමගින් අඩුවේ. රැකියා භ්‍රමණය සමඟ, මිනිසුන්ට නව පුද්ගලයෙකු සමඟ නව කීර්තියක් ගොඩනගා ගත යුතු අතර එමඟින් පුද්ගල අපකීර්තියට ලක්විය හැකි ක්‍රියාවන් හා සම්බන්ධ ක්‍රියා අඩු වීමේ සම්භාවිතාවක් ඇත. තවද, යමෙකු වැඩ කරන පරිසරය දූෂණ ක්‍රියාවන් සඳහා ප්‍රධාන සාධකයක් බව මනෝවිද්‍යාවේදී පැහැදිලි කරයි. දීප්තිමත් ලෙස ආලෝකමත් වූ සහ ජනේලවලින් පිරී ඇති කාර්යාලයකට වඩා ජනේල කිහිපයක් පමණක් සහිත අඳුරු කාර්යාලයක් තිබීම දූෂිත ලෙස හැසිරීමට කෙනෙකුගේ තීරණයට නිසැකවම අභිප්‍රේරණයක් වීමට ඇති හැකියාව වැඩිය.

දෙවනුව, කණ්ඩායමේ විශාලත්වය භූමිකාවක් ඉටු කරයි. කණ්ඩායම් ප්‍රමාණය කුඩා මට්ටමක තබා ගැනීම එම නිසා වැදගත් බව පර්යේෂණ වලින් පෙන්වා දේ.[3] දූෂිත හැසිරීම් වසන් කිරීමේ දුෂ්කරතාව වැඩි කළ හැකි උසස් භාවිතය වනුයේ කුඩා කණ්ඩායම් වශයෙන් නිලධාරීන් වැඩ කිරීමයි. අවසාන වශයෙන්, දූෂිත ක්‍රියාවන් ගැන කතා කිරීමට සහ රහස් හෙළි කිරීමට පෙලඹනේනන්හට ආරක්ෂිත සහ පහසුවක් දැනෙන සේවා ස්ථානයක් නිර්මාණය කිරීම ද අත්‍යවශ්‍ය බව ලේන්ග් විසින් පෙන්වා දී ඇත.

එම නිසා, මෙවැනි කරුණු රැසක් අන්තර්ගත වන ඉතාමත් වැදගත් හා රසවත් විෂය ක්ෂේත්‍රයක් ලෙස මනෝවිද්‍යාව හඳුන්වා දිය හැකි අතර දූෂණයට එරෙහි සටනට එමගින් විශාල පිටුවහලක් ලබා ගත හැකි බව ද සඳහන් කරමි.

**යූ.එල්.ජී.කේ.කේ. උස්වත්ත**
නීති සහකාර
නීති සහකාර අංශය

3 Lange , P. V. (2018). Psychological Perspectives on Corruption. IACAlumni Magazine. https://www.frontiersin.org/articles/10.3389/fpsyg.2018.01511/full



# දූෂණ වරදක් සැකවින් හැඳින්වීම

අසිත ඇන්තනි
සහකාර අධ්‍යක්ෂ ජනරාල්

1954 දී ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය විසින් අල්ලස් පනත ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී. එකී හඳුන්වාදීම අනුව එය 1954 අංක 11 දරණ අල්ලස් පනත ලෙස නම් කරන්නට යෙදී ඇත. එසේ වුවද ඊට ප්‍රථමව සිට ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ අල්ලස් සම්බන්ධව වන වැරදි දක්වා ඇත. දණ්ඩ නීති සංග්‍රහයේ 158, 159, 160 සහ 161 යන වගන්ති අල්ලස් සම්බන්ධ වන වැරදි ඇතුලත් කර ඇත. වර්තමානයේ අල්ලස් හා දූෂණ වැරදි සම්බන්ධයෙන් කටයුතු කිරීම ව්‍යවස්ථාදායකය විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පවරා ඇත.

දූෂණය නැමති වරද ශ්‍රී ලංකාවට හඳුන්වාදෙන ලද්දේ 1994 අංක 20 දරණ පනතේ ඉහත සඳහන් කළ අල්ලස් පනතට කළ සංශෝධන මඟිනි. 1994 දී බලයට පත් එවකට ආණ්ඩුව මෙම දූෂණය නැමති වරද හඳුන්වාදීමට පියවර ගනු ලැබුවේ දූෂණය නැමති වරද ශ්‍රී ලංකාව පුරා මෙන්ම මුළු ලෝකය පුරාම විහිදී ඇති බරපතල ප්‍රශ්නයක් බවට පත්ව ඇති බැවිනි. ඒ කෙසේද යත් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් දූෂණය පිටු දැකීම වෙනුවෙන් විශේෂ කර්තව්‍යයක් කරන ලද බව නොරහසකි.

මෙම දූෂණය වරද සම්බන්ධයෙන් විවිධ රටවල් විසින් විවිධ නිර්වචනයන් දක්වා ඇත. එනමුත් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් දූෂණය සම්බන්ධයෙන් දක්වා ඇති නිර්වචනය ජාත්‍යන්තර වශයෙන් පොදුවේ පිළිගත් නිර්වචනය බවට පත්ව ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාදායකය විසින් දූෂණය නැමති වරද නිර්වචනය කර ඇති ආකාරය කෙරෙහි අවධානය කිරීම වැදගත් වේ. මෙම දූෂණය වරදෙහි මූලික වශයෙන්ම කොටස් දෙකකට බෙදිය හැක. ඉන් එක් කොටසක් වන්නේ යම් තැනැත්තෙකුගේ මානසික ක්‍රියා කලාපය යි. හා එකී තැනැත්තාගේ එහි ශාරීරික කොටස වේ.

1994 අංක 20 දරණ පනතින් සංශෝධිත 1954 අංක 11 දරණ අල්ලස් පනතේ 70 වන වගන්තියෙහි, දූෂණය නම් වරද නිර්වචනය දක්වා ඇත. එනම්,

"70 ආණ්ඩුවට අයුතු සහගත ලෙස හෝ නීතිවිරෝධී ලෙස පාඩු සිදුකිරීමේ තමා වෙත හෝ යම් තැනැත්තකු වෙත අයුතු සහගත ලෙස හෝ නීතිවිරෝධී ලෙස අර්ථ ලාභයක් අනුග්‍රහයක් හෝ වාසියක් සිදු කිරීමේ චේතනාවෙන්, හෝ ආණ්ඩුවට හෝ යම් තැනැත්තකුට අයුතු සහගත ලෙස හෝ නීතිවිරෝධී ලෙස පාඩු සිදුවිය හැකි බව නැතහොත් යම් තැනැත්තකුට අයුතු සහගත ලෙස හෝ නීතිවිරෝධී ලෙස අර්ථ ලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් සැලසෙන බව දැන දැනම පහත දැක්වෙන යම් ක්‍රියාවක්, එනම්

(අ) රජයේ සේවකයා වශයෙන් වූ ස්වකීය ධූරය ප්‍රකාර කිරීමට තමාට බලය පැවරී ඇති යම් ක්‍රියාවක් කරන හෝ කිරීමෙන් වැලදී සිටින;

(ආ) රජයේ සේවකයෙකු වශයෙන් වූ ස්වකීය ධූරය ප්‍රකාර කිරීමට වෙනත් යම් රජයේ සේවකයකුට බලය පැවරී ඇති යම් ක්‍රියාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වැලකී සිටීමට, වෙනත් යම් රජයේ සේවකයකු පොළඹවන;

(ඇ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධූරය ප්‍රකාර කමාට දැනගැනීමට ලැබෙන යම් තොරතුරක් පාවිච්චි කරන;

(ඈ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධූරය ප්‍රකාර යම් තීරණයක් ගැනීමේලා සහභාගි වන;

(ඉ) රජයේ සේවකයකු වශයෙන් වූ ස්වකීය ධූරය කෙළින්ම හෝ අන්‍යාකාරයකින් හෝ පාවිච්චි කිරීමෙන් යම් ක්‍රියාවන් ඉටු කිරීමට හෝ ඉටු කිරීමෙන් වැළකී සිටීමට වෙනත් යම් තැනැත්තකු පොළඹවන;

යම් රජයේ සේවකයකු දූෂණය පිළිබඳ වරද සම්බන්ධයෙන් වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු 10ක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමකට හෝ රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතුය."

ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය තුළද දූෂිත ක්‍රියා සම්බන්ධයෙන් නඩු මෙහෙයවන බව අපහට විද්‍යාමාන වේ. මෙම 70 වන වගන්තිය අනුව වර්තමානයේ දූෂණය නැමති වරදක් සිදුවීමට තිබිය යුතු ප්‍රධාන අංග 3කි. එනම් රජයේ නිලධාරියෙකු වීම, එකී තැනැත්තා විසින් කරන ලද වරදෙහි මානසික අංගය මෙන්ම ශාරීරික අංගය සම්පූර්ණ වීම යනාදියයි. මෙහි මානසික අංගය ඔප්පු කිරීමේදී එකී රාජ්‍ය සේවකයා ඔහු චේතනාන්විතව මෙන්ම ඔහුගේ දැනීමට හසුවීමද එකී අංගය සපුරාලීමට ප්‍රමාණවත්වේ.

70 වන වගන්තියේ (අ සිට ඉ දක්වා) වන ක්‍රියාකාරකම් ඇතුලත් වේ. වර්තමානයේ මෙම දූෂණය නැමති වරද සම්බන්ධයෙන් කටයුතු කිරීමේ අධිකරණ බලසීමාව වන්නේ කොළඹ අධිකරණ කලාපය වේ. දූෂණය නැමති වරදට වරදකරුවෙකු වන තැනැත්තෙකුට අවුරුදු 10ක නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාර ගත කිරීම හා දඩය යන දෙකටම හෝ ඔහුට යටත් කිරීමට ගරු අධිකරණයට හැකි වේ.


වර්තමානයේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය මෙවන් කඩා වැටීමකට පත් වන්න මූලිකම හේතුව දූෂණය නම් පිළිකාව රාජ්‍ය තාන්ත්‍රය පුරාම විසිරී වැඩී වර්ධනය වන බැවිනි.

එබැවින් අප සියළු දෙනාගේම පොදු චේතනාව මෙන් ම එක ම ප්‍රාර්ථනාව ද විය යුත්තේ දූෂණයෙන් තොර රටක් බිහි කිරීමයි.

# අල්ලස් කොමිසමට
## පැමිණිලි කරන්න අලුත් ක්‍රමයක් ....

ෂම්මි ශ්‍රී ලාල්
දූෂණ නිවාරණ නිලධාරි
දූෂණ නිවාරණ අංශය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ අල්ලස හා දූෂණය මෙරටින් තුරන් කිරීම සඳහා වෙහෙස වෙන ප්‍රධාන ආයතනයි. කොමිෂන් සභාවේ කාර්යභාරය අතර අල්ලස් හෝ දූෂණ චෝදනා, වත්කම් බැරකම් ප්‍රකාශ සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීම ප්‍රධාන වන අතර ම, අල්ලස් හෝ දූෂණ චෝදනාවන්ට එරෙහිව, වත්කම් බැරකම් ප්‍රකාශ සම්බන්ධයෙන් නඩු පැවරීම හා පවත්වාගෙන යෑම ද සිදුවේ. මෙසේ වරදක් වීමට පෙර එය වළක්වා ගැනීම වඩා වැදගත් වන නිසා, අල්ලස් හෝ දූෂණ වැළැක්වීම සම්බන්ධයෙන් නිවාරණ කටයුතු කිරීම මගින් මහජනතාව හා රාජ්‍ය සේවකයා දැනුවත් කිරීමේ කටයුතු සිදු කරනු ලැබේ. මූලික වශයෙන් කොමිෂන් සභාව කටයුතු කරන අණපනත් අතර 1994 අංක 19 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත, 1954 අංක 11 දරණ අල්ලස් පනත හා 1975 අංක 1 දරණ වත්කම් බැරකම් නීතිය වේ.




"අල්ලස" යන්නේ අර්ථය සරලව ගත් කල, පෙළඹවීමක් හෝ ත්‍යාගයක් වශයෙන් නීත්‍යානුකූල හිමිකමක් නොමැති යම් තුටු පඬුරක් පිරිනැමීම, අයදීම හෝ භාර ගැනීම වරදක් ලෙස සලකන අතර ම එම වරද කිරීමට අනුබලදීම, කුමන්ත්‍රණය, තැත් කිරීම යන ක්‍රියාවන් ද අල්ලස් වරදට අයත් වේ.

අල්ලස් පනතේ 70 වගන්තියට අනුව දූෂණය යනු රජයේ සේවකයෙකු වශයෙන් රාජකාරි කිරීමේ දී නීතියේ සඳහන් ආකාරයට පටහැනි ලෙස යම් ක්‍රියාවක් කිරීමෙන්,නොකර හැරීමෙන්, ඉටු කිරීම වළක්වාලීමට පෙළඹවීමෙන් රජයට හෝ වෙනත් තැනැත්තෙකුට පාඩුවක් තමාට හෝ වෙනත් තැනැත්තෙකුට පාඩුවක් තමාට හෝ වෙනත් තැනැත්තෙකුට ලාභයක්, වාසියක්, අනුග්‍රහයක් සිදු කරන්නේ නම් එය වරදකි.[1]

යම් තැනැත්තෙකු අත් කරගෙන තිබෙන මුදල් හෝ මුදල් නොවන දේපල එම තැනැත්තාගේ දැනගත් ආදායම්වල හෝ ලැබීම්වල කොටසක් නොවිය හැකිව තිබූ විට , එම මුදල් හෝ මුදල් නොවන දේපල අල්ලස් මගින් අත්කර ගත් බවට නීතිය සලකනු ලබයි. මෙය අල්ලස් පනතේ 23 "අ" වගන්තිය යටතේ අයුතු වත්කම් උපයා ගැනීම යටතේ වරදකි.

ඉහත සඳහන් වරදට අදාළ සිදුවීම් සම්බන්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කිරීමේ හැකියාවෙ පවතී. නාමිකව හෝ නිර්නාමික පැමිණිලි කිරීමේ හැකියාව පවතින අතර ඉදිරි විමර්ශන සහා ප්‍රමාණවත් තොරතුරු සාක්ෂි සහිතව ඉදිරිපත් කිරීම වැදගත් වේ.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ලිපිනය වන අංක 36, මලලසේකර මාවත, කොළඹ 07 වෙත පැමිණ හෝ ලිපි මගින් ද ඉහත වැරදි සඳහා පැමිණිලි කිරීමේ හැකියාව ඇත.

**1954** කෙටි දුරකථන අංකය, +94 112 596360 යන ස්ථාවර දුරකථන අංකය හරහා මෙන්ම +94 112 595045 ෆැක්ස් අංකය මගින් ඔබට පැමිණිලි කල හැකි ය.

ඔන්ලයින් ක්‍රමවේදය හරහා www.ciaboc.gov.lk යන වෙබ් අඩවියට පිවිසීම මගින් පැමිණිලි කිරීමේ හැකියාව පවතී. පැමිණිලි කිරීමේ නව ක්‍රමය ලෙස ගම්පහ හා බස්නාහිර පළාත් වල ප්‍රධාන රජයේ ආයතන වල ස්ථාපනය කර තිබෙන පැමිණිලි පෙට්ටි පෙන්වා දිය හැක. මෙම පැමිණිලි පෙට්ටි ඒ ඒ ආයතන වල පිහිටා තිබුන ද සියලුම පරිපාලන කටයුතු සිදුකරනු ලබන්නේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසිනි.

1 Bribery Act 1954 11(Sri)

INTEGRITY PORTAL
සුපිළිපන් ද්වාරය
විද්‍යුත් සඟරාව | මංගල කලාපය

# අල්ලස සහ දූෂණය මර්දනයට තාක්ෂණයේ වර්ධනය සහායට...



එල්. ෂෙරින් ජැන්සන්
නීති සහකාර
නීති සහකාර අංශය

අල්ලස සහ දූෂණය එක්තරා දේශසීමාවකට සීමා නොවූ ජාත්‍යන්තර ගැටලුවකි. මේ නිසා මෙම ගැටලුවට විසඳුම් සෙවීම එක්තරා දේශසීමාවකට සීමා වූ දැනුමකට කල නොහැකි වේ. මේ වන විට අල්ලස සහ දූෂණයට එරෙහිව නීතිය ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත්, අල්ලස මර්දනය නීතියෙන්ම පමණක් කල හැකිද යන්න අප විසින් සොයා බැලිය යුතු කරුණකි. දැනට පවතින නීතියට එහා ගිය වෙනත් ක්‍රියාමාර්ගයන් අල්ලස මර්දනයට යොදාගත යුතු වේ. එසේ සිදුකිරීමට නම් අපගේ චින්තනයන් සමාජ අවශ්‍යතා හා සමාජ ගැටලු අමතමින් නව මං මාවත් විවර කරගත යුතු වේ.මෙම නව මාවත් අවශ්‍ය වනුයේ වර්තමාන සමාජයේ පවතින ගැටලු පවතින  නීතියකින් ආවරණය කරගත නොහැකි නිසාය. අප කෙතරම් නීතිය ප්‍රතිසංස්කරණය කල ද කාලය ඉදිරියට ගමන් කරත්ම මිනිස් මනස දියුණු වීමත් තාක්ෂණයේ දියුණුවත් නිසාවෙන් එකී නීතියෙන් පැන යාමට හැකි වන පරිදි අල්ලස් හා දූෂණය සම්බන්ධ ගැටලු ඉතා සංකීර්ණභාවයට පත්වෙමින් නීතියේ හිඩැස් ඇතිකරවීම ආරම්භ කරයි. එසේ නම් අපට පෙනී යන කරුණ වනුයේ නීතියට සමාජයේ පවතින මෙම අල්ලස් හා දූෂණ ගැටලුවලට තනිව පිළියම් සෙවීම කල නොහැක්කක් බවය. මේ නිසා නීතිය පමණක්ම නොවන වෙනත් මාර්ග අල්ලස හා දූෂණය මර්දනයට සොයාගැනීමට අපට සිදු වේ.

මෙහිදී ලෝකය සමඟ අප ඉදිරියට ගමන් කරන්නේ නම් දියුණු වන තාක්ෂණය අප විසින් යොදාගත යුතුම ය. තාක්ෂණය අද වන විට ආවරණය නොකරන ක්ෂේත්‍රයක් නොමැති තරම්ය. එසේ නම් අප මෙම තාක්ෂණයේ වර්ධනය අල්ලස් හෝ දූෂණය මර්දනයට යොදාගැනීමට ප්‍රමාද වන්නේ මන්ද .....

තාක්ෂණය යන්නෙන් අදහස් වන්නේ විද්‍යාත්මක දැනුම යන්ත්‍රානුසාරයෙන් ලබාගැනීම ලෙස අපට සරලව දැක්විය හැකිය. මෙම දැනුම ද නීතිය මෙන් ම මිනිසා විසින් ම ගොඩනගනු ලබයි. නීතිය මිනිසා විසින් නිර්මාණය කල ද එය නිර්මාණය වී අවසාන වූ පසුව එකී නීතිය නිර්මාණය කල මිනිසාට ඉහලින් එකී නීතය පවතින්නා මෙන් තාක්ෂණය ද මිනිසා විසින් නිර්මාණය කල ද මිනිසාට වඩා වැඩි කාර්යක්ෂමතාවයකින් හා මිනිස් මනසේ වේගය අභිබවායමින් තාක්ෂණය කටයුතු කරනු ලබයි. මේ අනුව මෙම තාක්ෂණය මගින්  වර්තමායේ මෙන්ම අනාගතයේ ද ගැටලු විසඳීමට ඉතා අනගිභවනීය සහයක් නීතියට ලබාගත හැකි බව පෙනී යයි. නීතිය මගින් හා තාක්ෂණයේ සහය මගින් ගැටලුවලට විසඳුම් මෙන් ම ගැටලු ඇති වීම වැළැක්විම ද කල හැකිය.

පරිඝනක අපරාධ පනත,[1] සාක්ෂි (විශේෂ විධිවිධාන පනත)[2], ඉලෙක්ට්‍රොනික් ගනුදෙනු පනත[3] මෙම තාක්ෂණයත් නීතිය හා එක් වීමට උදාහරණ ලෙස දැක්විය හැකිය. මෙහිදී මෙම නීතීන් අධිකරණයට දක්වන්නේ නොමඳ සහයක්ය. මෙම පනත් මගින් පරිඝනකයක, රෙකෝඩරයක වැනි නවීන උපකරණ වල ඇති සාක්ෂි උපයෝගී කරගන්නා ආකාරය දක්වනු ලබයි. මෙම පනත් වල ප්‍රතිපාදනයන් අධිකරණය ඉදිරියේ ඇති නඩුව ඔප්පු කිරීමට ඉතා ඉහල සහයෝගයක් ලබා දෙනු ලැබේ. අල්ලස් වැරදි සම්බන්ධයෙන් ද, දූෂණ චෝදනා වැරදි සම්බන්ධයෙන් ද මෙකී පනත් යටතේ ඇති ප්‍රතිපාදන භාවිතා වී ඇත.

කෙසේ වෙතත් ගැටලුවක් ඇති වූ පසුව නොව, ඇති වීමට ප්‍රථම ද තාක්ෂණය නීතියේ සහයට යොදාගත හැකි වේ. ඇති වූ ගැටලුවකට තාක්ෂණය යොදාගැනීම ප්‍රසිද්ධ කරුණක් වන අතර මෙහි දී මෙම සාකච්ඡාව අල්ලස මර්දනයට තාක්ෂණයේ වර්ධනයේ දායකත්වය කෙසේ නම් විය යුත්තේ ද යන්න දෙසට යොමු කිරීමට මා කැමැත්තෙමි.

මෙහිදී වංචාවන් අවම කිරීමට, දූෂණයන් සිදුවීම වැළැක්වීමට, අල්ලස් ගැනීම වැළැක්වීමට, බලය අයුතු ලෙස භාවිතා කිරීම වැළැක්වීමට, රජයේ විනිවිදභාවය පෙන්වීමට තාක්ෂණය යොදාගත හැකි වේ. උදාහරණයක් ලෙස ටෙන්ඩර් පටිපාටිය තාක්ෂණය

1 Computer crime Act 2007,24 (SRI) https://www.icta.lk/icta-assets/uploads/2016/03/ComputerCrimesActNo24of2007.pdf
2 Evidence (Special Provisions) Act 1995,14 (SRI)
3 Electronic Transactions Act 2006, 19 (SRI)

භාවිතයෙන් වෙබ් පිටුවකට යොමු කිරීම මගින් එය එකවර විවෘත කිරීම මගින් විනිවිද භාවයෙන් යුතුව අදාල ටෙන්ඩර් පටිපාටිය ක්‍රියාත්මක කල හැකි වේ. මෙහිදී රජයට තමන් විනිවිදභාවයෙන් කටයුතු කර ඇති බව ජනතාවට පසක් කර දිය හැකි වේ[4]. එසේම ටෙන්ඩර් පත් යොමුකල අයවලුන්ටද එයින් සාධාරණයක් ඉටු වේ. මෙහි දී බලය අයුතු ලෙස යොදාගැනීම වැළැක්වෙන අතරම රජයේ විනිවිදභාවය ද ඇතිවේ.



තාක්ෂණය බොහෝ විට සමීප වන්නේ වර්තමාන තරුණ පරම්පරාවටය. මෙහි දී අපට පාසල් සිසුන් කෙසේවත් අමතක කල නොහැකි වේ. ළදරුවෙක් ඉපදුන දා සිට තමන්ගේ කනට ඇසෙන දේ කථා කරන්නට පටන් ගනී. ඒ අනුව අප යම් භාෂාවක් උගන්වන්න සුදුසුම වයස ලෙස හඳුනාගනු ලබන්නේ ළමා වියයි. ඒ අනුව අල්ලස සහ දූෂණය සම්බන්ධයෙන් දරුවන්ට දැනුවත් භාවය ලබාදීම මගින් වර්තමානය නොව අනාගතය යහපත් කරගැනීමට එයින් විශාල දායකත්වයක් ලබාදිය හැකි වේ. මේ නිසා අල්ලස හා දූෂණය සම්බන්ධ දැනුවත් කිරීම් ළමා හා තරුණ පරපුර ඉලක්ක කරගැනීම පහසුවෙන් සමාජශෝධනයට ළඟා විය හැකි ක්‍රමය වේ. කෙසේ නමුත් සැබෑව නම් අල්ලස හා දූෂණය දරුවන්ට හා තරුණ පරපුරට ඉතා සමීප හා ප්‍රියජනක මාතෘකාවක් නොවීමයි. මේ නිසා එය ඉතා සමීප හා ප්‍රියජනක ස්වරූපයකින් ඔවුන් වෙත ළඟා කල යුතු වේ. මේ සඳහා අපට තාක්ෂණය භාවිතා කල හැකි වේ. වර්තමානයේ ළමුන් පරිගණකය භාවිතයෙන් විවිධ ක්‍රීඩා සඳහා යොමු වීම, චිත්‍ර ඇඳීම වැනි දෑ වලට යොමුව ඇත. මෙයින් පරිගණක ක්‍රීඩා ඉතා ජනප්‍රියත්වයක් උසුලනු ලබයි. අල්ලස සම්බන්ධයෙන් පරිගණක ක්‍රීඩා නිර්මාණය කරමින් එය ඉතා ප්‍රීතිජනක ලෙස දරුවන්ට සමීප කරවීම අපට කල හැකි වේ. මෙහිදී ප්‍රශ්නාවලි සාදමින් ඒවාට පිළිතුරු සැපයීමට විවිධ ක්‍රීඩා යොදාගත හැකිය. මෙම ක්‍රමවේදය ඉගෙනුම් ක්‍රමවේදයක් ලෙස වෙනත් රටවල පවා භාවිතා වේ.[5]

තිරසාර සංවර්ධනයේ අත්‍යවශය අංගයක් ලෙස අල්ලස හා දූෂණය පිටුදැකීම හඳුනාගත හැකිය.[6] එසේ නම් එකී තිරසාර සංවර්ධනය කරා ගමන් කිරීමට නම් සාම්ප්‍රදායික රාමුවකට කොටු නොවූ පුළුල් මනසකින් යුක්තව ක්‍රියා කරමින් අල්ලස හා දූෂණය මර්දනයට තාක්ෂණයේ වර්ධනයත් එකතු කරගත යුතුව තිබේ.



4 The World Bank. (2022). Combating Corruption. https://www.worldbank.org/en/topic/governance/brief/anti-corruption
5 Law Revision. (n.d.). Contract law quiz on offer and acceptance. Retrieved December 1, 2022, from http://e-lawrevision.org.uk/Offer-and-acceptance-quiz.php
6 United Nations. (2022). Peace, justice and strong institutions - United Nations Sustainable Development. https://www.un.org/sustainabledevelopment/peace-justice/

# අපරාධ අධිකරණයේ දිග හැරෙන අතීත මතක සහ යුක්තිය



ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන්නේ අපරාධ නීතියට අදාලව චෝදනාත්මක විමර්ශන ක්‍රමය වේ. එම ක්‍රමය තුල දී සාක්ෂිකරුවෙකුගේ ප්‍රකාශයක් මත හෝ තොරතුරක් මත පොලිස් විමර්ශන ආරම්භ වන අතර, පැමිණිල්ල නඩුව මෙහෙයවීමක්, විත්තිය විසින් විත්තිකරු වෙනුවෙන් පෙනී සිටීමක් සිදුවන අතර, මැදිහත් විනිසුරුතුමෙකු විසින් නඩු තීන්දුව ලබා දෙනු ලබන අතර, අවස්ථා කීපයකදීම අභියාචනා කිරීමේ අවස්ථාව ලබාදී ඇත.

අපරාධ නඩුවකදී සාවද්‍ය මනස සහ සාවද්‍ය ක්‍රියාව විත්තිකරු විෂයෙහි, සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කල යුතු අතර, ඔප්පු නොවූ විට නිර්දෝෂීභාවයේ සළුවෙන් වසා දමා සිටි විත්තිකරු නිදොස්වීමට හේතුවේ.

වඩා වැදගත් වන්නේ, අපරාධ නීතිය තුල අධිකරණයේ දිග හැරෙන සියලු සිද්ධීන් සිදුවී අවසන්ව තිබීමය. සිදුවී අවසන් සිද්ධිය තුල ඇත්තේ සිද්ධියට භාජනය වූ පුද්ගලයන්ගේ මතකයන් වේ. ඒ මතකය මත ප්‍රකාශ ලබාදී විමර්ශනය ආරම්භ වේ. අපරාධ නීතිය තුළ මතකයට ඇත්තේ ඔබ නොසිතන අපූර්ව යුක්තියකි. සාක්ෂිකරුවෙකුට හොඳම මතකය වේ නම් ඔහුගේ සාක්ෂිය විශ්වාසවන්තය, පිළිගත හැකි සහ නිවැරදි බවට පෙනී යයි. මතකය අපූර්ව මෙවලමක් බවට පත්වන්නේ හරස් ප්‍රශ්නවලදීය. අපූර්ව පිළිවෙලකට තිබුනු මතක සිද්ධි උඩු යටිකුරුද, මාරුවෙනුද, පටලවනුද, නැති කරුණු එකතු කරමින් යෝජනා කිරීම් ද දැකිය හැකි අතර, නීතියේ රාමුව තුළ වුව හුදු සාක්ෂිකරුවාගේ මතකය ගැන කිසිවෙකුට අප රටේ මැදිහත්වීමට හැකියාවක් නැත. මතකය මිනිසාට ලබාදී ඇති අපූර්ව දායාදයකි. මතක මනෝ විද්‍යාඥයන්ට අනුව මතකය වඩා නිරවුල්ව තබා ගැනීම සඳහා ඒ ඒ පුද්ගලයාගේ සෞඛ්‍ය, වයස, අවධානය, උවමනාව, කැමැත්ත යනාදී සාධක බලපාන අතර, අමතක වීම සඳහා එම සාධකයන්ට ප්‍රතිවිරුද්ධ දෑ බලපානු ලැබේ. තමා අකමැති සිද්ධීන් දැඩිව අල්වාගෙන නොගෙන මතකයෙන් පලවා හැරීමට පෙළඹවීම පුද්ගල ස්වභාවය වේ. එවැනි තමාට මතක තබාගැනීමට අකමැති සිද්ධීන් පෙළින් පෙළ සිදුවූ ආකාරයටම අපරාධය නැවත දර්ශනය කරවීම නැතිනම් අපරාධව නැවත උසාවිය තුල සාක්ෂි මතින් නිර්මාණය කිරීම සිදුවේ. මෙම නැවත අපරාධය අධිකරණය තුල දර්ශනය කරවීම සිදු කරනු ලබනුයේ සාක්ෂිකරුවන්ගේ මතකය පදනම් කරගෙනය. යුක්තිය යනු මතකය පරීක්ෂා කර හොඳම මතකය ඇති සාක්ෂිකරු උසාවිය ඉදිරියේ විශ්වාසවන්ත සාක්ෂිකරු බවට පත්වී සත්‍ය ගවේෂණය කිරීම දැයි නොසිතන්නේ මන්ද;

මතකය හරි අපූර්ව වන්නේ එය ගොඩනැගී ඇති මනෝමය චිත්‍ර (Mental Schemas) මතය. මනෝවිද්‍යාඥ Brewery & Tregens (1981) විසින් පරීක්ෂණයක් සිදුකර ඔප්පු කරනුයේ මනෝමය චිත්‍රමත පුද්ගලයන් දේවල් විග්‍රහ කරන බවය. එහිදී පුද්ගයන් 61 ක ප්‍රමාණයක් ගෙන පරීක්ෂණ කාමරයක් නිරීක්ෂණය කිරීමට ලබාදුන් අතර, එහි කාර්යාලීය උපකරණ බොහොමයක් සහිතව කාර්යාලීය කාමරයක හැඩරුවට සකසා තිබුණි. එක් අයෙකුට තත්පර 35 ප්‍රමාණයක් නිරීක්ෂණයට ලබාදී පසුව එහි තමා නිරීක්ෂණය කල දේ මතකයෙන් ලිවීමට ලබාදුන් අතර, පුද්ගලයන් සියල්ලම කාර්යාලීය උපකරණ සිය කොලවල ලියා තබා තිබුණු අතර, ඊට හේතුව මොවුන්ට කාර්යාලීය කාමරයක් පිළිබඳව තිබූ මනෝ චිත්‍රය. එහි තිබූ දෑ සැබෑ ලෙස



නොදැක මනෝ චිත්‍රය මත කටයුතු කර තිබුණි. සාක්ෂිකරුවෙකුගේ සාක්ෂියේ ද මෙවැනි මතක පරතර පුරවන අවස්ථා දැකිය හැකිය. මෙම පර්යේෂණය තහවුරු කරනුයේ මිනිස්සුන්ගේ මතක ස්වභාවය පිළිබඳව ය. ඉතාම වේගයෙන් සිදුවන සිදුවීම් දාමයක් ගැන මෙහොතකට සිතන්න. ඒ සිදුවීම් සිදුවන වේගය මත පුද්ගලයකුගේ අවධානය ලබාදී යමක් මතකයේ තබා ගැනීමට තරම් මනස සන්සුන් නැත. එවැනි මතකයන් තුල පිළිවෙල නැත. පිළිවෙලට නැති මතක අතර, පරතර උසාවියේ දී අසත්‍ය කරුණු මතින් පිරවේ. ඒවා ප්‍රශ්නයට ලක්වේ. විශ්වාසනීයත්වයට දොස් තබයි. එසේම මතකය කාලය සමඟ වියැකීයාම සාමාන්‍යය ස්වභාවය වේ. පවත්නා නඩුවල කල්ගතවීම යන කාරණය ද සමඟ ඔබට, මතකයට සාක්ෂිකරුවෙකුගේ කුමක් වේදැයි නොසිතන්නේ මන්ද;

සිද්ධියක් දීර්ඝකාලීන මතකයක් (LTM) බවට පත්වීම යන ජීව විද්‍යාත්මක පැහැදිළි කිරීම අනුව කෙටි කාලීන මතකයේ (STM) හි තත්පර 2 ක ප්‍රමාණයක් තිබී අවශ්‍ය දේ පමණක් දීර්ඝකාලීන මතකය බවට පත්වේ. මිහිරි දේ දැකීමද, අමිහිරි දේ මතකයෙන් ඉවත්වීමද, එම ආකාරයටම ඒ දෑ මනසින් දැකීමද මනුෂ්‍යාගේ සාමාන්‍ය ස්වභාවය වේ. එසේ වන්නේ නම්, යුක්තිය ඉටුවීම තුල එනම්, නිර්දෝෂීභාවයේ සළුවෙන් වසා ඇති විත්තිකරු වරදකරු බවට පත් කිරීමට යොදා ගන්නා සාමාන්‍ය ක්‍රමවේදය සිද්ධියට පාත්‍ර වූ සාක්ෂිකරුවන්ගේ මතකය වේ. එම මතකය මෙවැනි ආකාරයේ වේ නම් උසාවිය යනු සාක්ෂිකරුවෙකුගේ මතකය පරීක්ෂා කරන ස්ථානයක් දැයි නොසිතෙන්නේ මන්ද;

අතීතය තුල සිදුවී අවසන් වූ සිද්ධිය උසාවියේදී නැවත දර්ශනය කරවීම (revisit) සිදු කරන ලංකාවේ ක්‍රියාපිළිවෙල අනුව පැමිණිල්ලේ සාක්ෂිකරුවෙකුට, තමා විසින් සිද්ධිය වූ වහා හොඳ මතකය තිබෙන අවස්ථාවක දී ලබාදුන් ප්‍රකාශය සාක්ෂි ලබාදීමට පෙර පරිශීලනයට අවස්ථාව නැත. එසේම දියුණු රටවල අධිකරණ පද්ධතිය තුල අධිකරණ මනෝවිද්‍යාඥයෙකුගේ (Forensic Psychologist) සහාය විශේෂඥ සාක්ෂියක් ලෙස ගැනෙන අතර, ගරු අධිකරණයේ දී සාක්ෂි ලබාදෙනු ලබන විට සාක්ෂිකරුවෙකුට මතක පිළිබඳ ගැටළුවක් ඇති බවට ගරු විනිසුරු ආසනයට හෝ පැමිණිල්ලේ නීතිඥවරයාට පෙනී යන විට සාක්ෂිකරුවාට නඩු විභාගය අතරතුර අධිකරණ මනෝ විද්‍යාඥයා වෙත යොමුකර (inquiry - voir dire) මතය ලබාගැනීමට හැකියාව ඇත.

අප රටේ ද එවැනි අධ්‍යාපන ක්‍රමයක අවශ්‍යතාවය සහ එවැනි විශේෂඥයකුගේ මතයක අවශ්‍යතාවය දැඩිව ඇති බව පෙනී යයි. එසේම මතකය නැවත ප්‍රතිව්‍යුහගත කිරීමේ විද්‍යාත්මක ක්‍රමයන් ද පවතී. නඩු විභාගය තුළ මෙවැනි පරීක්ෂණයකට යොමු කිරීම කොතරම් ඉදිරිගාමී පියවරක් දැයි නොසිතෙන්නේ මන්ද;


අල්ලස හා දූෂණය තුරන් කිරීමේ ක්‍රමවේදය තුල දී අපරාධ නිවාරණය කල හැකි පිළිගත් ක්‍රමවේදයක් වන දඬුවම සහ දැඩි දඬුවම් යන නිවාරණ පිළිවෙත මත, යුක්තිගාමී අධිකරණ පද්ධතියක් තුල සත්‍ය ගවේෂණය කිරීම සඳහා මෙම ගැටළුකාරී තත්ත්වයන්ට පිළිතුරක් ලෙස පැමිණිල්ලේ සාක්ෂිකරුවන්ට සිය ප්‍රකාශයන් සාක්ෂිදීමට පෙර පරිශීලනයට ප්‍රවේශය දීමත්, මතකය පිළිබඳ ගැටළු ඇති විට නඩු විභාගය තුලදී විශේෂඥ මතයක් (inquiry - voir dire) ලබාගැනීමට යොමු කිරීමටත්, හැකිවන ලෙස යුක්තිය පසිඳලන ක්‍රමවේදය නැවත ප්‍රතිව්‍යුහගත කිරීම හොඳම නිවාරණ ක්‍රමයක් වනු ඇත.

**තුසිතා ජයනෙත්ති**
සහකාර අධ්‍යක්ෂ (නීති)
නීති අංශය



1 Loftus.EF & Pickrell, J.E(1995) the formation of false memories Psychiatric analysis
2 Curter,B,L & Penrod,S,D (1995) Mistaken identification analysis: the eye witness. Psychology and law, Cambridge MA Harvard University Press
3 David N,.(1998) American Courts & Criminal Justice System
4 Role of Forensic Psychologist in criminal justice, 2022, http: fun.edu/role/forensic psychology criminal/justice/

# අල්ලස දූෂණය සම්බුද්ධ ධර්මය ඇසුරින්



අල්ලස දූෂණයෙන් සමාජය වෙලාගත්තා යැයි සියලු ප්‍රජාවෝ රජයට, රජයේ සේවකයන්ට දෛනිකව චෝදනා කිරිමේ ප්‍රතිශතය ඉහළ යමින් පවති. චෝදනාවන් ඉහල යන්නාසේම රාජ්‍ය නිලධාරින් අතින් සිදුවන අල්ලස් හා දූෂණ ක්‍රියා ද දෛනිකව ඊට වඩා වේගයකින් ඉහළ යමින් පවති. ආර්ථික සුරක්ෂිතතාවය පවත්වා ගැනීමට නම් අල්ලස, දූෂණයෙන් තොර සමාජයක් ගොඩනැගිය යුතුය. එසේ ගොඩනැගීම සඳහා ප්‍රධාන වගකිවයුත්තා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව යැයි බැලූ බැල්මට පෙනේ. එමෙන්ම අපට ද එය සත්‍යක් ලෙස දැකිය හැකිය. පුරාණ සමාජය තුල අල්ලස දූෂණය යන වචනයන් නොතිබුණාසේ ම එහි අර්ථයවත් ඔවුහු දැන නොසිටියහ. ඔවුන් කීවේ "හොරාකෑම" යන වචනයයි. ප්‍රාථමික සමාජය නොදියුණුයැයි පවසන වර්ථමාන සමාජය හොරාකෑම යන වචනයට නෛතික නිර්වචන ගණනාවක් මේවන විටත් අර්ථකතනය කර ඇත. ඒවානම් සොරකම, වංචාව, සාපරාධි විශ්වාසය කඩ කිරිම, සාපරාධි සාවද්‍ය පරිහරණය, කොල්ලකෑම, ගෙවල් බිඳ දේපල සොරකම් කිරීම, අල්ලස, දූෂණය, මුදල් විශුද්ධිකරණය ආදි නව වචනයන්ය. මෙවැනි නීතිමය අර්ථකතන ඇති වචන ගණනාවක් බිහිවුයේ සමාජය දියුණු නිසායැයි යමෙක් පවසන්නේ නම් ඔහු ද නොදියුණු බව දැනුමෙන් නොව නුවණින් විමසා බැලීම වටී. වර්තමාන සමාජයේ නව විෂයන් හතු පිපෙන්නාක් මෙන් බිහි වන්නාසේම ඒ සඳහා පර්යේෂණ ආයතන, ආචාර්යවරුන්, රැකියාද. හතු පිපෙන්නාක් මෙන් නිර්මාණය වේ. එම විෂයන් ඉගෙන ගන්නා වූ සමාජය දැනුමින් පෝෂණය වන බවනම් සත්‍යයකි. නමුත් ගුණයෙන් නම් අපොහොසත්ය.

ඉහත සඳහන් අපරාධ වැරදි වැඩි වශයෙන් කරන ශ්‍රී ලංකාවේ රජයේ සේවකයෝ ඉතා පහත් තත්වයට සමාජය විසින් ඇද දමා ඇත. එමෙන්ම ඔවුන් විසින් බටහිර රටවල් වල පවතින සමාජ සංස්කෘතික තත්වයට ඉතා අගනාකමක් සපයන්නාසේම එම සමාජයට ගොස් ජීවත්විමටද මනා ප්‍රියතාවයක් දක්වයි. ඒ සඳහා ඔවුහු පිඹුරු පත්‍ද දවසින් දවස සකස් කරති. නමුත් ලෝකයේ අනෙකුත් රටවල් වල ඇති පාරිසරික තත්ත්වය හා මේ දිවයිනේ ඇති පාරිසරික තත්ත්වය අධ්‍යනය කිරීමේදි ස්වභාවිකවම ඉතාම අලංකාර දේශය මේ ශ්‍රී ලංකාද්වීපයයි. එවැනි දේශයක ජීවත්වෙන්නා වූ ජනයාට සතුටින් ජීවත්වීමට නොහැකිවීමට හේතු වන්නේ ඉහත සඳහන් අපරාධ වැඩිවීම මත බව මේ දිනවල සියලු මාධ්‍යන් මගින් හා සමාජ මත අනුව දැකගත හැකිය.

සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් සාරා සංකල්ප ලක්ෂයක් මුළුල්ලේ පෙරුම් පුරා අවබෝධ කලා වූ සද්ධර්මයේ පළවෙනි කෘත්‍ය නම් තෙරුවන් සරණයාමය. ඊළග පියවර නම් පංචශිලයවත් ගිහි සමාජය විසින් ආරක්ෂා කිරීමය. පංචශිලයෙහි දෙවන ශික්ෂාපදය "අදින්නාදානා වේරමනි සික්ඛාපදං සමාදියමි". එනම් අනුන්ට අයත් වස්තුවක් එහි ස්වාමිත්වය දනිමින්ම හොරෙන් හෝ ඔහු රැවටීමෙන් බියගැන්වීමෙන් බලහත්කාරයෙන් ගැනිම අදත්තාදානයි.[1] තව දුරටත් පැහැදිලි කරන්නේ නම් අන්සතු වස්තුවක් බව දැනීමය. පැහැරගනු කැමැති සිතය. පැහැර ගැනිමට උපක්‍රමකිරීමය, වස්තුව ගැනීම යන අංගයන් ය. මෙම අංගයන්ගෙන් එකක් හෝ අඩුවුවොහත් අදත්තාදාන කර්මය අසම්පුර්ණය. යම්කිසි වස්තුවක් සොර සිතින් ගත්තේ ද හිමිකමක් නැති වස්තුවක්වේ නම් එයින් අදත්තාදාන කර්මය සිදු නොවේ. හිමිකමක් ඇති, හිමිකරු විසින් නොදුන් වස්තුවක් වුව ද සොර සිතින් තොරව හිමිකරු කෙරෙහි විශ්වාසය ගත්තේ ද අදත්තාදාන කර්මය අසම්පුර්ණය. අන්සතු වස්තුවක් තමාට අයත් යැයි යන හැඟිමෙන් ගත්තේ ද අදත්තාදාන කර්මය සිදු නොවේ. මේ අනුව චේතනාවම මුල්කර ගනිමින් අදත්තාදාන කර්මය සිදුවන බව සම්බුද්ධ ධර්මය අනුව පැහැදිලිය. නීතිමය

1 රේනුකානේ චන්දවිමල මහා නාහිමි, 1949, බෞද්ධයාගේ අත්පොත

අර්ථකතනය ගෙනහැර බැලිමෙදි ද මේ හා සමාන කමක් දක්වා ඇතත් එය අසම්පූර්ණ බව විවිධ නීති වගන්ති හඳුන්වාදීමෙන් එය පැහැදිලිවේ.

අනුන්ට අයිති වස්තුවක් නඩු කියා තමන්ට අත්පත් කර ගැනීම අනුන් සතු වස්තුවක් තමන් රැගෙන යන කල සොර සිතින් ගැනීම නොදෙමි, යන චේතනාව තමා වෙත පරිස්සමට තැබූ දෙයක් නොදී පරිභෝජනය කිරීම, අනෙකෙකු විසින් ගෙන යන්නා වූ අන්සතු වස්තුවක් ඒ තැනැත්තා ලවාම වෙනත් තැනකට ගෙන්වා ගැනීම, තිබෙන තැනින් වෙනස් කිරිම, අනුන් සතු සත්වයෙකු නඩු කියා අයිතිකර ගැනීම, සත්‍යන් අතර මගදි  මාර්ගය වෙනස් කර ගැනීම, තමා භාරයේ ඇති අන්සතු වස්තුවක් නොදී ගැනීම, සත්ත්වයෙකු  බිය ගන්වා අන්තැනකට ගෙන්වා ගෙන තමා සතු කර ගැනීම, සියතින්ම සොරකම් කිරීම, අනුන් ලවා සොරකම් කිරීම, බදු නොගෙවා භාණ්ඩ නිදහස් කරගැනීම අයිතිකරුට එම භාණ්ඩයේ කැමැත්ත නැති කිරීමෙන් පසු තමන් භාරයට ගැනීම, හිමියෙකු ඇති ඉඩමක් තමාට අයිති බව දන්වා ගැනීම.  කිරුම් මිණුම් කිරීමෙදි අඩු වැඩි කිරීම, පළුදු හෝ දිරූ හෝ නොවටිනා හොඳ භාණ්ඩ ගුණාත්මක භාණ්ඩ සේ හගවා විකිණීම, රන් රිදි ලෙස හඟවා වෙනත් එවැනි පාට ඇති දෑ විකිණීමෙ, හොර නෝට්ටු හොර කාසි මුද්‍රණය, බස් රථයේ දුම්රියේ ටිකට් නොමැතිව හා වෙනත් පංතියක ටිකට් එකකින් හොඳ පංතියේ ගමන් කිරීම. නුවණ නැතිවුන් උපායකින් රවටා  ඔවුන්ගේ භාණ්ඩ ගැනීම, අනුන් තලාපෙළා බිය ගන්වා භාණ්ඩ ඉල්ලා ගැනීම හෝ බලෙන් ලබා ගැනීම. සොරබඩු ඇතැයි සිතා සොරබඩු නැති පෙට්ටියක් රැගෙන යාම කර්මාන්ත කරන ස්ථානයන්හි භාණ්ඩ සගවා පසුව රැගෙන යාම, හිමියා තමාට අයිති නැතියැයි සිතන තැනට පත්කර රැගෙන යාම, සීට්ටුවක් ගන්නා අවස්ථාවේදි සීට්ටු පොත මාරු කිරීම, ප්‍රමාදවී රාජකාරි වාර්තා කිරීම, කාර්යාලයෙන් කලින් යාම, රාජකාරි කාලය තුල වෙනත් කාර්යන් කිරිම, ආදි ක්‍රියා අදත්තාදාන කර්මයට අයිති වේ.



ඉහත නීතිමය වගන්ති හා අදත්තාදාන කර්මය අතර වෙනස සාකච්ඡා කිරිමේදි අනාගතයේ බිහිවෙන්නා වූ නීතිමය වගන්ති වල කරුණු ද මෙම ශික්ෂා පදය තුල අන්තර්ගතව ඇති බව විශ්ලේෂණය කිරීමේ දී පැහැදිලිවේ.

එසේ නම්  ඉහත නීතිමය වගන්ති අනුව වැරදි කරන පුද්ගලයින් අල්ලා දඩුවම් කිරීම පුනරුත්තාපනය කිරීම, කරනවා වෙනුවට පවුල තුල ශිලය ආරක්ෂා කිරීමට කුඩාකල පටන්  පුහුණු කරවන්නේ නම් අල්ලස, දූෂණයෙන් හා අනෙකුත් දේපල පිළිබඳ අපරාධ රහිත අඩු සමාජයක් ගොඩනැගීම ඉතා පහසුය.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ශ්‍රී ලංකා පොලිසිය, විසින් නිවාරණ කටයුතු සිදු කිරීමෙදි බටහිර පර්යේෂණ ක්‍රම යොදා ගන්නවා වෙනුවට  සිල් රැකිමට, මේ සමාජය හුරුකරන්නේ නම් යහපත් සමාජයක් ගොඩනැගීම ඉතා පහසු වේ.

සමාප්තයි !

ජේ.එච්.එම්.ජී අබේසිංහ
ප්‍රධාන පොලිස් පරීක්ෂක
දූෂණ විමර්ශන අංශය

# අල්ලස දූෂණය නැති කිරීමට නීති අණපනත් වලින් ඔබ්බට

## මානුෂීය ආකල්ප මිනිසා තුළ ස්ථාපිත කිරීම සිද්ධ කළ යුතු ය

අල්ලසින් වැඩ කරගැනීම සහ දූෂණයෙන් ජීවිතයේ හරි හම්බ කරගැනීම් වැනි සාමාන්‍යත්වයට පත් වූ ක්‍රියාවන් ශ්‍රී ලංකාව නැමැති අපේ රටේ සුලබත්වයට පත් වී ඇති කාරණයකි. ආසියානු රටවල සීඝ්‍රයෙන් පැතිරී ගොස් ඇති මෙම ක්‍රියාව විශේෂයෙන් ම අප රට තුළ විශාල වශයෙන් ව්‍යාප්ත වී ඇත්තේ ජනතාව විසින් ම එය එදිනෙදා ජීවිතයේ ඔවුනොවුන් අතර සිද්ධවෙන කටයුත්තක් ලෙසට පත්කරගෙන ඇති නිසා ය.

අල්ලස හා දූෂණය ලාංකීය සමාජයෙන් තුරන් කිරීමට අද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ක්‍රියාමාර්ග මගින් නීති රීති ක්‍රියාත්මක කිරීමත් , නිවාරණ වැඩමුළු පවත්වමින් අල්ලසින් දූෂණයෙන් තොර යහපත් සමාජයක් නිර්මාණය කිරීමට ක්‍රියාත්මක කරන වැඩපිළිවෙල නිසා ජනතාව අතරට මෙම ක්‍රියාවන්හි නීති විරෝධී තත්ත්වයන් හඳුනාගැනීමට දැනගැනීමට ඉවහල් වී ඇත.

අල්ලස් පනතේ සඳහන් නීති රෙගුලාසීන් සහ නියමයන් ජනතාවට මෙන් ම රාජ්‍ය සේවය තුළ හඳුන්වා දීමෙන් අද හුදෙක්ම විවේචනයට ලක් වී ඇති රාජ්‍ය සේවය තුළ සිදුවන අල්ලස සහ දූෂණය බොහෝ දුරකට මැඩ පැවැත් වී ඇත. තවදුරටත් අල්ලස් ගැනීමේ දී හා අල්ලස් ලබාදීමේ වැරැද්ද නිසා අද බොහොමයක් රාජ්‍ය සේවකයන් නීතියේ රැහැනට අසු වී ඇත.

කාලයක් පුරාවට අණපනත්වලින් මෙම අල්ලස සහ දූෂණයේ ප්‍රතිවිපාක හඳුන්වා දුන්නත් අපගේ රට තුළ එම ක්‍රියාවන් තුරන් වී නැත. දිගින් දිගටම පැමිණිලි සංඛ්‍යාව වැඩිවීමත්,වැටලීම් වැඩි වීමත් තුළින් සුපිළිපන්නභාවය උත්තම රාජ්‍ය සේවය තුළ ස්ථාපිත වනවාට වඩා ඒකී ජනතාව තුළ නීති රෙගුලාසි , දඬුවම් සහ සත්‍යවාදීභාවය අභිබවමින් එහා ගොස් දූෂණ වංචාවන් වැඩිදුරටත් ක්‍රියාත්මක වන ආකාරය අද දැක ගත හැකිය.

මෙහි දී මතු වී ඇති ගැටලුව වන්නේ නීති පැනවීමෙන් සහ අණපනත්වලින් වගේ ම දඬුවම් පැමිණවීමෙන් පමණක් ම රටක් තුළ පවතින අල්ලස හා දූෂණ වංචාවන් නතර කිරීමට හැකියාවක් තිබේ ද යන්නයි.

නීතියක් ක්‍රියාත්මක වන රටක එම නීතියට එපිටින් කටයුතු කිරීමට අද ලාංකික ජනතාව හුරු පුරුදු වී සිටිති. එම නිසාම හුදෙක් රටේ රාජ්‍ය සේවය තුළ නීතිය නොතකමින් අල්ලස් ලබා ගැනීම, දූෂණය සහ වංචාව බියකින් තොරව සිද්ධ වෙමින් පවතී. නීතිය නොතකන සමාජයක් සියලු ක්‍රියාදාමයන් හමුවේ සත්‍යවාදි වී අවංකව කටයුතු කිරීමෙන් තමා , තමා තුළම අවංකභාවය නැමැති ආකල්පය නිර්මාණය කරගැනීම තුළින් යහපත් වූත්, සුපිළිපන්න වූත් සමාජයක් ප්‍රායෝගිකව ගොඩනැගීම සිද්ධ කරගත හැකිය.

ඔබ අසා ඇති සුනිල් එදිරිසිංහ නැමැති ගායකයාගේ "මිනිසා සුවඳයි මල සේ" නැමැති ගීතය. ඒ ගීතයෙන් කියවෙන්නේ යහපත් වූත්, සත්‍යවාදී වූත් නිවැරදි ආකල්ප වලින් පරිපූර්ණ මිනිසා දසත සුවඳ හමන පුද්ගලයෙක් බවට පත්වෙන බවයි.

සුවඳවත් මිනිසාගේ සිතිවිලි සුවඳය. ඔහුගේ හෝ ඇයගේ ආකල්ප සුපිරිසුදුය. ඔවුන් තම රාජකාරිය අවංකව ඉටු කරති. මාසික වැටුපට ණය නොවෙති. තම කාර්යයන් ඉෂ්ඨ සිද්ධ කරගැනිමට අල්ලස ලබා නොගනිති. එමෙන් ම කුමන රාජකාරියේ හෝ වේවා ඒකී රාජකාරිය තුළ දූෂණය වංචාව සිදු නොකරති.



ප්‍රායෝගිකව රාජ්‍ය සේවකයෙක් හෝ වේවා ඕනෑම පුරවැසියෙක් තමන්ගේ ආත්ම දමනය මෙසේ සිදු කරගන්නේ නම්, යහපත් ආකල්ප ඇති කරගන්නේ නම් තමා,තමාට ගෞරවය සහ ආදරය ලබා දෙන්නේ නම් යහපත් මාර්ගයෙන් එපිටට පැන අතුරු මාර්ග හරහා තම කාර්යයන් ඉෂ්ඨ සිද්ධ කරගැනීමට කවරදාකවත් උත්සාහ ගන්නේ නැත.

නිශ්ශංකමල්ල රජතුමා අල්ලස් ගන්නවුන් තවත් ආත්මයක දී කපුටන් බවට පත් වී උපත ලබන බව පොලොන්නරු යුගයේ ශිලා ලිපියක සඳහන් කර ඇත. එම යුගයේ පටන් මෙම විෂය ගැන නොයෙක් අර්ථකථනයන් ප්‍රකාශයට පත්ව ඇත්තේ මහා ඉතිහාසයකට උරුමකම් කියන ලාංකේය ජාතියේ හුරුපුරුදු, ආකල්ප සහ හැසිරීම් අල්ලස දූෂණය හමුවේ උපහාසයට ලක් වී ඇති නිසාවෙන් බව කිව හැකිය.

එවන් වූ සමාජයක් අද දක්වා පරම්පරාවෙන් පරම්පරාවට එවැනිම ආකල්පයන් සහ හැසිරීම් රටාවක් රැගෙන පැමිණීම නිසා මේ අල්ලස හා දූෂණය නැමැති විනාශකාරී සංකල්පය රට තුළ ක්‍රියාත්මක වෙමින් පවතී.

පුද්ගලයෙකු රාජ්‍ය සේවකයෙකු, ඉන් පරිබාහිර හෝ වෙනත් කාර්යයක නිරත වී ඇති කෙනෙක් හෝ ව්‍යාපාරිකයෙකු හෝ ජීවත් වන්නේ ඉතා කෙටි කාලයකි. මෙම විශ්වයේ පවතින මූලධර්මයන් වන්නේ සෑම ක්‍රියාවකටම ප්‍රතික්‍රියාවක් ඇති බවයි. තමන් කරන හොඳ ක්‍රියාවකට හෝ නරක ක්‍රියාවකට ප්‍රතික්‍රියාව තමාට අනිවාර්යයෙන් ම පැමිණෙන්නේ ය.

එම නිසා දූෂණය වංචාව නැමැති ආකල්පවලින් මිදී අනාගත දරුපරපුරට තමන්ගේ දෙමව්පියන් පිළිබඳ ලෝකයක් ඉදිරියේ ආඩම්බරව කතා කිරිමට සුදුසු පරිසරයක් තනාදීම අද වැඩිහිටියන්ගේ වගකීම වන්නේ ය. එම වගකීම ක්‍රියාත්මක කිරීමට නීතියේ වගන්තිවලට එහා ගොස් ආත්ම සුපිරිසිදුබාවය තමා තුළ ප්‍රායෝගිකව ඇති කරගැනිම සිද්ධ කරගත යුතුය. ඉතිහාසයේ පටන් යහපත් ආකල්ප මඟින් අල්ලස දූෂණය තුරන් කරගැනීමට නොහැකි වූ සමාජයක් තුළ අද දරුවන්ගේ සිට ආත්ම දමනය, සත්‍යවාදී බව තමා තමනට අවංකව කටයුතු කිරිම යන ධනාත්මක ආකල්ප වටහා දිම තුළින් හා හඳුන්වා දීම තුළින් රාජ්‍ය සේවය තුළ පමණක් නොව මුළු මහත් සමාජය තුළට සුපිළිපන්න වූ පරපුරක් ගොඩනංවාලිය හැකිය. එය නීතියේ අණපන් වලට එහා ගොස් ඇති මානුෂීය වගකීමක් ම වන්නේ ය.

**කේ. ඒ. චරක බණ්ඩාර වික්‍රමසිංහ**
නීති සහකාර
නීති සහකාර අංශය

# මෙඩූසාට පෙම් කරමුද?


එන්.ඩී.එන්.සී. ජයසිංහ
දූෂණ නිවාරණ නිලධාරී
දූෂණ නිවාරණ අංශය

ෆ්‍රොයිඩියානු හිස්ටිරියාව මනුෂ්‍යයා තුළ පවතින අවරෝධිත හිස් බවට කැඩපත් ඇල්ලීමකි. ඇනා ඕ, ඩෝරා... ඒ අපූරු ස්ත්‍රීත්වය නූතන මනෝවිශ්ලේෂණයේ උප්පත්තිය වෙනුවෙන් තමන්ගේ ගර්භාෂය දුන් අතීතයේ උන්නු ඒ හිස්ටරික ගැහැණුන්ය. අනෙකුත් ස්ත්‍රී ප්‍රවාහයම කිසිදා ලෙහාගත නොහැකි කුමක්දෝ දෙයක් වෙනුවෙන් පැටළිලි සහගතව ෆ්‍රොයිඩ්ගේ ආත්මයට ලංවූවන්ය. ඒ ආත්මීය ප්‍රකාශනය කාන්තාවන්ට පමණක් ලඝු වූවක් නොව සමස්ත මනුෂ්‍යය සංහතියේම සාමාන්‍යකරණය බැවු ෆ්‍රොයිඩ් හඳුනාගත්තහ. ඒ නම් හිස්ටිරියාව යන පුද්ගල හිස්බවින් අර්ථ නිරූපිත වන කලාත්මක දෘශ්ටිමය බවය. තවද ඒ රික්තය ඌණපූර්ණයට පුද්ගලයා ග්‍රීක පුරාවෘතයන්හි මතුවන නාගයන් සිය හිස බවට පත් කරගත් මෙඩූසා සමග වූද ප්‍රේමයෙන් වෙලෙන බව අතිශයෝක්තියක් නොවේ.

ඔවුන්ගේ හඬ විසින් මනෝ විශ්ලේෂණයේ උත්පත්තියට මඟ කියා දුන්නා පමණක් නොව එහි අනාගත න්‍යාය සහ භාවිතය යන සියලු දේ තීරණය කළහ. එදා මෙදා තුළ මේ දක්වා හිස්ටිරියාව මනුෂ්‍ය සමාජයේ පැවත ඇති නමුත් අද එය පවතිනුයේ එක් එක් ආකාරයට වෙස් වළාතැනීමක් සමග බැවින් සෘජු විවරණයක් නොමැත. ෆ්‍රොයිඩියානු යුගයේ  පැවති ආකාරයට නොවුණත්, එතරම් සමාජයට නිරාවරණය නොවී නමුත් ඊට වඩා තීව්‍ර ලෙස එය අප තුළ පැවතීමට හැක. එදා සිට අද දක්වා ගතහොත් මනෝ විශ්ලේෂණයේ න්‍යාය යුහුසුළුව ගතිකත්වයට පත්ව ඇත. ඒසේ වුව ද හිස්ටිරියාව වෙනුවෙන් මනෝ විශ්ලේෂණය ලබා දී ඇති නිර්වචනය අද දක්වාත් විපර්යාසාත්මක වෙනසකට පත්ව නොමැත. හිස්ටිරියා රෝගියා ගේ වේදනාව සහ ඒ වේදනාවේ ප්‍රභවය වෙනුවෙන් අදත් මනෝවිශ්ලේෂණය ලබා දෙනුයේ එම පැරණි නිර්වචනයම වේ.

විවෘතව ඉතිහාසය තුළට කිඳා බසින්න හැකි නම් ඔබට දෘශ්‍යමාන වෙයි රෝගය ප්‍රභවය පවතිනුයේ ඊගෝවෙහි යන්න. ඉන් ගම්‍ය වනුයේ අහමයයි. අතෘප්තිමත් අහමක් (unsatisfied ego) සර්වත්‍රික හිස්ටරික වේදනාවක් පසුපසම පවතී. ඔවුන් ඒ අතෘප්තිමත් අහම හිස්ටරිකකරණයට ලක්කරයි. ඒ හරහා යමින් ජුවාන් ඩේවිඩ් නාසියෝ (Hysteria from Freud to Lacan) "අතෘප්තිමත් අහමකට ගැහැණු පිරිමි කියල වෙනසක් නැත"[1] යනුවෙන් පවසයි. එහෙයින් අහම අශාව තෘප්ත කිරීමේ ඊනියාවාදී ෆැන්ටසියක සැම මනුෂ්‍යයෙකුම ධ්‍යානගත වෙමින් භෞතිකමය ප්‍රපංචයන් මත මෙම හිඩැස සම්පූර්ණ කරගැනීමේ මනෝරාජික උත්සහයක් යෙදේ. එම තත්ත්වය කෙතරම් අශිෂ්ලද යත් යුක්ති යුක්ත නොවන මංමාවත් ද පුද්ගලයා පැවැත්මේ තුවාල සුවපත් කිරීමේ දී භාවිත කරයි.

නමුත් මෙම රික්තය සම්පූර්ණ වනුයේ බාහිර ලෝකයේ හිස් බව තමන්ගේ ආත්මයේ හිස් බව සමඟ සමපාත කිරීමෙන් ය. එය අධ්‍යාත්මික ලෙස ග්‍රහණය කර ගනු වස් ජපන් ශුන්‍යතා



දාර්ශනිකයෙක් වන නිශිදා කිතරෝ උත්සුක වූයේ බෞද්ධ අර්ථයෙනි. නමුත් හිස් බව යනු අත්දැකීමක් ලෙස ග්‍රහණය වීම අවශ්‍යය. එනම් ස්වයං අත්දැකීමක්, අවබෝධයක් වශයෙනි. හෛඩගර් පවසනුයේ නිදහස ආරම්භ වනුයේ හිස්බවෙන් යන්නයි.

ඒ මගින් අභිඋපගමනය කළ හැක්කේ සාංදෘෂ්ටික දර්ශනයේ ආරම්භය සනිටුහන් වනුයේ සාංකාව (ngst) නිසා නම් ඒ සාංකා තත්ත්වය ජනනය වන්නේ ද පැවැත්මේ හිස් සමඟ බැවුය. ඒ හිස් බව මත පදනම්ව බිය (fear) යන සාධකය පැනනගී. අප බිය වෙන්නේ කුමන යන කරුණට ද යන්න පිළිබඳව ද අපට විඥානයක් නොමැත. මේ පරම හිස්බව (Absolute nothingness)



සමනය කරගැනීමට යාමේදි හිස්ටිරියානු ආතතියක් හටගැනීම තුළ මාර්ගයන්ගේ යුක්ති ගරුකබාවය මනින මිනුම් දඬු තව දුරටත් අවභාවිතයට ලක්වීම උගහට නොවේ. නමුත් භෞතිකව ගොඩනගාගත් සුවදායක තත්ත්වයන් අස්සෙන් නැවත අපිට හිස් බව දෘශ්‍යවීම ආරම්භ වේ. මන්ද භෞතිකත්වය සැම විටම හිස් නිසාවෙනි. භෞතිකත්වය විසින් නිර්මිත අර්ථයන් හිස්. ඒ අර්ථ ඇතුළෙන් පේන හිදැස් වල අවකාශය ද හිස්ය. ඒ හිදැස් තුළින් නිරාවරණ වෙන්නේ අපිට තැනක් නැති බවයි (no-place). නමුත් ඒ ලෝකයේ පියනැගීමට බිය වීම අවශ්‍යය කරුණක් නොවේ. 'හිස් බවට සමාන කරන්න පුළුවන් වෙන කිසිවක් නැහැ. මේ තියන්නේ හිස් බවෙන් ගැබ්බර වූ ලෝකයක' (මාටින් හෛඩගර්)[2].

අල්ලස හෝ දූෂණය යනුත් මෙම රික්තය අස්වැසීමට භාවිතකරණයේ යෙදෙන මෙඩුසා වැළඳගැනීමකටය. මෙතුළින් ගොඩනගාගන්නා භෞතික ප්‍රපංචමය ලෝකය මතින් පුද්ගලයා භෞතිකමය නිර්වාණයක් අපේක්ෂා කරයි. ජිලැක් ගේ විවරණය මීට වඩාත් ප්‍රහාරාත්මක ප්‍රස්තුතයක් ගෙන එයි. එනම් නිර්වාණය තියෙන්නේ වෙන කොහෙවත් නෙමෙයි. මෙතැන මේ මොහොතේ. මේ මිනිස්සු එක්ක. යන ආන්දෝලනාත්මක ප්‍රකාශයයි. එවන් පරමේන්ද්‍රිය ප්‍රාණියෙකු වීමට නම් භෞතිකත්වය පරයායන ප්‍රහර්ශයක් අවශ්‍යය. එනම් විනයයි. විනය නම් මනුෂ්‍ය ආත්මයේ ගැඹුරින් එන තේරීමක් වේ. වරණයක් ආශාවක් වීමට හැකිය. ඒහෙත් ඒ ආශාවේ සීමාව පෙන්වන්නේ විනය විසින්ය. සත්‍ය ලෙසම ස්වයං-විනය විසින් නීතිය තවදුරටත් ශූන්‍ය සාධකයක් බවට පත් කරයි. සමාජය ගැඹුරින් අත්දකිමින් අපගාමයෙන් මිදී මානූෂිය බව අනන්‍ය කරගනුයේ ස්වයං-විනය යන සාධකය ආත්මගත වූ දිනටය. සංස්කෘතික වීම යනු මෙම විනය තමන් ඇතුලේ වගා දිගා වීමක් වේ. ෆ්‍රොයිඩියානුවාදය අපගෙන් අයදිනුයේ එක් කරුණක්ය. ව්‍යාජ සංනාමකරණයක් නොව සත්‍ය ලෙසම සංස්කෘතික වීමය.

අවසන මේ සරුව පිත්තල ලෝකෙන් සදහටම ආපසු නොඑන්න යන ගමන්....මඟ හරින්න බැරි තරම් ඉන්ද්‍රජාල තිබියදීත් ඒවා පසුකර යමින්. ආශාවේ සියළු සැඩ පහරවල් විසින් ඔබ ආශාවේ අභිප්‍රාය දිශාවට තල්ලු කරන විටදී පවා ඒ සැඩ පහරට එරෙහිව උඩුගං බලා පිහිනන්න.... (එමානුවෙල් කාන්ට්) යන මතවාදී අදහස සිහිපත් කරයි[3].

නමුත් ඔබ දැනටමත් මෙඩූසා විරෝධියෙකු නම් නීට්ෂේනියානු විඥානයෙන් සිතීම වඩාත් යුක්ති සහගතය. එනම්, රාක්ෂයින් සමඟ සටන් වදින සෑමවිටම ඔබ තවත් එක් රාක්ෂයෙක් නොවන්නේ කෙසේද යන්න ගැන සැලකිලිමත් වන්න. අගාධය දෙස ඔබ බලා සිටින හැම විටකම අගාධය ද ඔබ දෙස බලා සිටිනු ඇත. (නීට්ෂ, සරතුස්තා මෙසේ කීය). Whoever fights monsters should see to it that in the process he does not become a monster' And if you gaze long enough into an abyss" the abyss will gaze back into you Friedrich Nietzsche" Thus Spoke Zarathustra[4]'

---

1කොන්ටෙන් මෙයසු, සුමනසේකර වංගීස, තීර්ථ ප්‍රකාශන, පි 18.
2නූතන බටහිර දර්ශනය,කලංසූරිය එ.ඩී.පි, අධ්‍යාපන ප්‍රකාශන, පි 204.
3Immanuel kants critique of pure reason" Smith .N. K"Macmillan and co"Limited"p.103
4Mind in evolution"Third edition. p. 125 ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය (Bibliogaphy)

5එදිරිසිංහ, දයා., 2005 මනෝවිද්‍යා විමර්ශන, වත්මා ප්‍රකාශකයෝ, දෙහිවල.
6ගෝඩර් යුස්ටයින්., 2019.සොෆීගේ ලෝකය, විදර්ශන ප්‍රකාශන, නුගේගොඩ.
7කලංසූරිය එ.ඩී.පි, 2007.නූතන බටහිර දර්ශනය., අධ්‍යාපන ප්‍රකාශන"
8 Sutherland"E." 1960,.Prtinciples of Criminilogy"New york"
9 Vernon P.E." 1969, Personality Assessment."London"
10 Beneke, Friedrich Eduard. 1832.Kant und die philosophische Aufgabe unserer Zeit: Eine Jubeldenkschrift auf die Kritik der reinen Vernunft. Berlin: Mittler.
11 Bird, Graham. 1972,.Philosophical Tasks: An Introduction to Some Aims and Methods in Recent Philosophy. London: Hutchinson University Library.
12 Bristow, William,.2007.. Hegel and the Transformation of Philosophical Critique. Oxford: Oxford University Press.
13 Buroker.1996.,Cambridge: Cambridge University Press.



# පන්හිඳ

## කඩුපුල් දේශයට

මේ කලුව
සදාකාලික නම් නොවේ
හෙට නොවේ
නම් අනිද්දා
පායාවි හිරු ඉතින්
නපුරු සිත් විසි කරම
පුරහඳක් වැහෙන කොට
කළුවලා සළුවකින්
හිරුට විතරක් හැකිවේ ද
නපුරු සිත් පරදන්න
අපි අපිම අවුලුවන
මහා මුඩු වියරුවක්
දවාලනු චිතකයේ
සුසානය කෙලවරක
සිලෙන් සිල දල්වමින්
රාත්‍රිය පසුකරමු සීරුවෙන්
එන්න අපි පෙළගැසෙමු
කඩුපුල් දේශයට

**එම්. එම්. ආර්. උපාලි**
දූෂණ නිවාරණ නිලධාරී
දූෂණ නිවාරණ අංශය

## සුපිළිපන්න වෙමු..

නිලයට බලයට ලොබ බඳිමින්නේ..
මුදලට කැදර ඇති මිනිසුන්නේ..
කඳුලද දහදිය නැත හඳුනන්නේ..
උස් මිටිකම් මත ඇයි හැකිලෙන්නේ..

තම යුතුකම් ටික නැත හඳුනන්නේ..
රකුසන් මෙන් නිළ තල හොබවන්නේ..
තම පරපුර ගැන පමණි සිතන්නේ..
මුදලට අතමිට ඇයි මොලවන්නේ..

කරනා මෙහෙයට වැටුපක් ගන්නා..
සරණක් ඇවැසිව පිහිටක් වන්නා..
හෙට රට දැය වෙනුවෙන් වෙහෙසෙන්නා..
සුපිළිපන්න මිනිසෙක් බිහිවෙන්නා..

**නුවන් ප්‍රියංග හපුහෙට්ටි**
විමර්ශන නිලධාරි
විමර්ශන අංශය





# අල්ලස හා දූෂණය පිටු දකිමු ...!

අල්ලස් සිද්ධියක් ආවොත් දැනගන්න
දහ නවයයි පනස් හතර අමතන්න
පසු විපරම්ද සිදු කරමින් විමසන්න
උත්තේජයකි කොමිසම එය අරගන්න

තම වැඩ කොටස කඩිනම් සිදුකර ගන්න
සමහර දෙනා පෙළඹේ අල්ලස් දෙන්න
රජයේ පිරිස් වැඩ කඩිනම් කර දෙන්න
එවිටයි සිදුවන්නේ අල්ලස දුරලන්න

අල්ලස, දූෂණය නම් අඩු කරවන්න
"සුපිළිපන්න" වචනය අද පතුරන්න
දැනුමට, පළපුරුද්දට අද තැන දෙන්න
එවිටයි "සුපිළිපන්න" යා හැක වන්න

**ලලිත් පන්නිල**
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
තොරතුරු තාක්ෂණ අංශය



# සිපිරි ගෙයි සැඳෑවක

මේ පාලු සිර ගෙදර
හිරු බසින ගොම්මනක
තනිව මා සිටින විට
සිහි වුණා පෙර මතක....

ලද දෙයින් නොසෑහී
සිත යටින් උමතු වී
අල්ලසට සිත ඇදී
සිත ගියා මුලාවී....

යදම් ලා මා දෑත
රැගෙන යන මොහොතේදී
කළ වැරදි මතක් වී
කෑ ගසා හැඬුවෙමි....

මතකයට දූ පුතුන්
එන විටදී හද දවන්
උණු කඳුළු ගලා යය
කොතැන වැරදුණි කියා....

මිදුණු දින සිර ගෙයින්
සොයා යමි දූ පුතුන්
නමුදු සිත ඉකි බිඳී
පිළිගනී දැයි ඔවුන්........ මා....?

යූ. ජී. ඩී. එල් වික්‍රම ආරච්චි
දූෂණ නිවාරණ නිලධාරී
දූෂණ නිවාරණ අංශය



# අල්ලස දූෂණය තුරන් කිරීම..

ඉපදුන රටට ණය නැති මිනිසෙක් වන්න
අඹුදරු මාපියන් හට නිසි සැලකුම් දෙන්න
ඔබ හට ලැබුණු රැකියාවට පින් දෙන්න
වේතනයට සරි ලෙස මෙහෙවර දෙන්න

දිවි සැරියට ඇත අගහිඟකම් එමට
ලද දේ තුළින් දත යුතු සැනසුම ගැන්ම
නැති මුත් අපට සිත්සේ සැප විඳගන්න
යුතු නැත අන් දනන් මුදලට ලොබවන්න

සේවය ලබාගැන්මට ඔබ වෙතට එන
සේවා ලාභියා වෙත ගරු සරු ඇතිව
තම සේවයේ නිසි ගරුසරු රකිමින්ම
නිසි යුතුකම පමණක් ඉටු කරලන්න

අල්ලස දූෂණය ගැන ඔබගේ සිත් එත්ම
නවතාගන්න එම සිතුවිල එසැනින්ම
ඔබ මෙන් අන් අය ද එක සේ දුක් ගැහැට
විඳ උපයන මුදල් යුතු නැත අයැදීම

උතුම් සේවයට නිසි වේතනය ලැබ
පිරිසිදු සිතින් අඹු දරුවන් රැක ගැන්ම
දහසින් බැඳි පියලි කෙල කෝටියක් ලැබ
විඳිනා රජ සැපට වැඩි සැපතක මිතුර

කෙදිනක හෝ අවසන දිවි ගමන දුර
සැනසුම් සිතින් සුසුමක් හෙලනා දිනට
කුමට ද දුක් සෝ සුසුම් එක් කර ගන්න
අයුතු අසාධාරණ දේ සිදු කෙරුම

තම දුක්ගැහට කියමින් ඔබ වෙතට එන
ජනයා වෙත හෙලන් කරුණාබර බැල්ම
උන්ගේ දුක අසා සිත් සනසා ලන්න
අවැසි සේවාව සතුටින් කර දෙන්න

ලද ඇසිල්ල නො අරගන් වාසියට
නොකරන් බලපෑම් මුදලට ගිජු සිතින
සකසා ගන්න ඒ ඇසිල්ල අන් අයට
සුපිළිපන්න වී සේවය කර දෙන්න

සොරකම, බලපෑම අන්සතු දේ ගැන්ම
වනසාලයි ඔබ මෙන් මුළු රට දැයම
නවතාලිය හැකිය සිත තුළ ඇති වීම
දමනය කළොත් පව් සිතිවිලි නොපමාව

**ප්‍රියංවදා ජයලක්ෂ්මී රාජපක්ෂ**
කළමණාකරණ සේවා නිලධාරී
ආයතන අංශය

# දෙසිතක දෑස

දෙසිතක දෑස බොඳ වෙලා
අසරණ සරණයෙක් කලා
අල්ලස් ගන්න ගිහින්
අල්ලස් දෙන්න ගිහින්
දිවියම අතරමං වුණා..............//

සේවය නාමෙන් අයදින මුදලට
සිපිරි ගෙයක් තුළ හඬනු එපා.........
හිමි නැති වස්තුව දෝතින් ලං කර
ලෙස දුක් කතරක විඳිනු එපා..........


අහසේ තරු සේ ම
අල්ලස වපුරන්න එපා
පෙරදිග වී අටුව
කඳුලින් පුරවන්න එපා

දෙසිතක දෑස

තුන් හෙළයම මව් බිමේ
ඉපිද මියෙන මගේ රටේ
දූෂණ අල්ලස නොදෙන්න
නැගිටිමු අපි ජාතියේ
අත්ල විහිදුවා සමුගෙන යන්නට
උතුම් මිනිසෙකු වන්න රටකට

දෙසිතක දෑස

**පී.ඩබ්.එන්.වසන්ත**
උප පොලිස් පරීක්ෂක
විමර්ශන අංශය



# වගා පාළු වන්දිය

කුඹුරු යායම පාලු වීලා
වගතුවක් නෑ මෙදා පාරත්
තිබුණු ඩිංගිත්තත් වල් ඌරෝ කාලා
ඒක හන්දයි බුදු මහත්තයො
වන්දි ගන්නට දහදොළොස්වර
ගාටන්නේ මං මෙහෙම

ඉඩමේ ඔප්පුව උකස් කරලා
ලෙඩ ඇඳට වැටිලා ගෙදර උන්දැත්
වන්දි දෙනවයි එදා කිව්වට
තාම නැනේ දොයිතුවක්වත්

දන්නවා මං
මහතැන්ගෙ කරුණාව
සමාවීලා යන්ට අවසර
දෙන්නෙ කොහොමද පන්දාහක් ම
ඉල්ලුවට ඔහෙ මගෙන්
ගෙදර උන්දැගේ බෙහෙත් ටිකටත්
හාරදාහත් පැනලා

**තුෂාරි දයාරත්න**
සහකාර අධ්‍යක්ෂ (නීති)
නීති අංශය



# අල්ලසින් නැහැවූ මවක ගේ කඳුල

නව මසක් කුස දරන්
සෙනෙහසින් බිහිකරපු
පුතෙකු නොව ඔබ
රජෙකු විලසින්
නැණස වඩවා
රජ ගෙදර ගිය දවස
රජු සනසන්නට
තුටු පඬුරු අයදිමින්
දිළිඳු වැසියන්
විඩාකරයි නම්
කෙසේ කියම් ද මා
ඔබ රජකෙු බව ලොවට

**එල්. ෂෙරින් ජැන්සන්**
නීති සහකාර
නීති සහකාර අංශය

# කවරයෙහි කතාව



සුපිළිපන්න බව රැකගත යුතු ගුණාංගයකි. රැකගතහොත් සියවසක් කල් පවත්නා වටිනාකම් නිමවන්නකි. සත්ව ලෝකයෙහි නාමකරණයකින් සංකේතවත් කරන්නේ නම්, සුපිළිපන්නභාවය සමරූපි වන්නේ, කැස්බෑවා නම් වූ සාගර ජීවියාට වේ. මහපොළොවත් මහසයුරත් අතර සැරිසරන මේ සුවිශේෂි සත්වයා, සෑම කලාපයකදී ම වගා කරගත යුතු සුපිළිපන්නභාවයට කදිම අර්ථ නිදර්ශනයක් වන්නේ ය.

# හිමිකම අත්හැරීම

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි දූෂණ නිවාරණ අංශයෙහි මෙහෙයවීමෙන් මෙම සය මාසික විද්‍යුත් සඟරාව නිර්මාණය කර ඇත. අල්ලස සහ/හෝ දූෂණයෙන් තොර සුපිළිපන්න ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ මුඛ්‍ය පරමාර්ථයෙන් යුතුව නිර්මාණාත්මක නවමු සංකල්පයක් විලසින් මෙම සඟරාවෙහි මංගල කලාපය සිංහල භාෂාවෙන් සම්පාදනය කර ඇත. මෙම විද්‍යුත් සඟරාවෙහි අන්තර්ගතය පවත්නා වලංගු කරුණුවලින් සමන්විත වේ. ඒවායෙහි නිර්වද්‍යතාවය සහ පරිපූර්ණත්වය සහතික කිරීම උදෙසා ප්‍රායෝගිකව දැරිය හැකි සකල් ප්‍රයත්නයන් ම දරා ඇති අතර මෙහි පළකර ඇති නිර්මාණයන්හි පූර්ණ වගකීම එම නිර්මාණයන්හි හිමිකරු සතුව පවතී. එසේ හෙයින් මෙම සඟරාවෙහි අන්තර්ගත කිසිවක් සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව කිසිදු වගකීමක් දැරීමක් හෝ සහතිකවීමක් සිදු නොකෙරේ.



European Union

UNDP

unicef for every child